# ඉඩම් පරිහරණ සැළසුම් මාර්ගෝපදේශ සංග්‍රහය

## නව සංස්කරණය - 2013

**ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව**
**අංක 31, පතිබා පාර,**
**නාරාහේන්පිට**
**කොළඹ 05.**
**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

# පෙරවදන

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ලංකාව පුරාම විවිධ මට්ටම් වලින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීමත් සිදු කරනු ලැබේ. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම දක්වා ව්‍යාප්ත වූ කාර්ය මණ්ඩලයක් ඇති අතර, එම කටයුතු දිස්ත්‍රික් නිලධාරින් ප්‍රමුඛ දිස්ත්‍රික් කාර්යාල වලින් සහ කොළඹ ප්‍රධාන කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමත් ඒ හා සම්බන්ධ අනෙකුත් කාර්යනුත් තාක්ෂණික කාර්යයන් බැවින් ඒ පිළිබඳව නිරන්තර දැනුවත් කර නිපුණතාවය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමනිසා දෙපාර්තමේන්තුව මගින් නිලධාරීන් නිසියාකාරව පුහුණු කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රමවේදයන් ඇතුලත් කර මාර්ගෝපදේශ සැකසීමද සිදු කරනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාව සඳහා මුලින්ම ඉඩම් පරිහරණ සැලසුම් මාර්ගෝපදේශ සංග්‍රහයක් 1986 දී සකස් කර ඇති අතර, ඉන් පසුව 2005 වර්ෂයේදී නැවත මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කරන ලදී. දෙවෙනි වරට සකසන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ එවකට මෙම ආයතනය මගින් සිදු කරන ලද වැඩ සටහන් සඳහා මාර්ගෝපදේශ ලබා දෙන ලදී. එසේවුවද, මෙම ආයතනය 2010 ජනවාරි මස දෙපාර්තමේන්තුවක් බවට පත්වූ පසු වැඩ සටහන් පුළුල් වීමත්, අලුත් වැඩසටහන් හඳුන්වා දීමත් සිදු විය. එබැවින් එම නව වැඩසටහන් හා ක්‍රමවේදයන් පිළිබඳව නිලධාරින් දැනුවත් කිරීම හා ඔවුනට මග පෙන්වීම සඳහා 2005 දී සකස් කරන ලද මාර්ගොපදේශ සංග්‍රහය නව සංස්කරණයක් ලෙස මෙලෙස එළි දැක්වීමට තීරණය කරන ලදී.

මෙම නව මාර්ගෝපදේශ සංග්‍රහය මෙම ආයතනයේ නිලධාරීන්ට විශේෂයෙන් නවක නිලධාරීන්ට මෙන්ම අප ආයතනයේ කටයුතු අධ්‍යනය කරන වෙනත් ආයතන හා පුද්ගලයින් සඳහා ඉතා වැදගත් ග්‍රන්ථයක් වනු ඇත. මෙය පරිශීලනය කිරීම තුලින් දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වඩා විධිමත් ලෙස ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙහි කරුණු හොඳින් අධ්‍යනය කර වෙනත් මූලාශ්‍රද භාවිතා කර තමන්ගේ වෘත්තිය හැකියාවන් ප්‍රගුණ කර ගනිමින් ඉතා හොඳ සේවාවක් රටට ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

පි.එම්. ශාන්ති ප්‍රනාන්දු

අධ්‍යක්ෂ

# ස්තුතිය

ඉඩම් පරිහරණ සැලසුම් මාර්ගෝපදේශ සංග්‍රහය අලුතින් සංස්කරණය කිරීමේ අවශ්‍යතාවය නිරතුරුවම පෙන්වා දීමත්, එය කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමත් පිළිබඳව ඉඩම් පරිහරණ සැලසුම් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා පි.එම්. ශාන්ති ප්‍රන්නන්දු මහත්මියට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

2005 වර්ෂයේදී සකස්කරන ලද ඉඩම් පරිහරණ මාර්ගෝපදේශ සංග්‍රය මෙම නව සංස්කරණය සැකසීමේදී බෙහෙවින් ඉවහල් විය. පළමු පරිච්ඡේදයේ විස්තර කර ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සැලසුම සැකසීමේ නව ක්‍රමවේදය නව සංස්කරණයට ඇතුලත් කර ඇත. එමෙන්ම දෙවෙනි පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති භූමි ඇගයීම ඉතා සරල ආකාරයට මෙවර ඉදිරිපත් කර ඇත. පැරණි මාර්ගෝපදේශ සංග්‍රයේ තිබූ ඉඩම් දත්ත බැංකුව, ඉඩම් පරිහරණ කමිටු සහ ඉඩම් පරිහරණයට අදාළ නීති රීති ඒ ආකාරයෙන්ම මෙම නව සංස්කරණයට ඇතුලත් කර ඇත. එබැවින් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් විසින් මුල් ග්‍රන්ථය සඳහා දැක්වූ දායකත්වය බෙහෙවින් අගය කරන අතර, එසේ නොවනන්ට මෙතරම් කඩිනමින් නව සංස්කරණයක් එළි දැක්වීම අපහසු වනු ඇත.

කෙටුම්පත් කරන ලද නව සංස්කරණය අධ්‍යනය කර එහි අඩුපාඩු පෙන්වා දීම සහ එය වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම පිළිබඳව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්), බි. ඒ. ජයනන්ද මහතාටද ස්තුතිවන්ත වෙමි.

සංස්කාරක

## පටුන


පිටු අංකය

පෙරවදන
පටුන
වගු ලැයිස්තුව
රූප සටහන් ලැයිස්තුව

**පළමු පරිච්ඡේදය**

හැඳින්වීම 1
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හා සැළසුම් කටයුතු 1
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් 2
විවිධ මට්ටමේ ඉඩම් පරහරණ සැළසුම් සම්පාදනය 3
හැඳින්වීම 3
ජාතික මට්ටම 4
පළාත් හා දිස්ත්‍රික් මට්ටම්… … … … … … … … 7
ප්‍රාදේශීය මට්ටම... ... ... ... ... ... ... ... ... 12
ගම් මට්ටම හෝ ක්ෂුද්‍ර ජල පෝෂක මට්ටම 22

ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන... ... ... ... ... ... ... ... 22
හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය සඳහා වැඩ සටහන් සැකසීම... ... 23

**දෙවන පරිච්ඡේදය**

භූමි යෝග්‍යතා නිර්ණය කිරීම... ... ... ... ... ... ... ... ... 26
ඉඩම් ශක්‍යතා අධ්‍යනය තුලින් යෝග්‍යතාවය පිලිබඳ තීරණය කිරීම... ... ... 27
කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි ඇගයීම... ... ... ... ... ... 30
ඉඩම් පරිහරණ යෝග්‍යතා වාර්තා ... ... ... ... ... ... 36

**තෙවන පරිච්ඡේදය**

ඉඩම් දත්ත බැංකු… … … … … … … … … … … 47
හැඳින්වීම... ... ... ... ... ... ... ... ... ... 47
ඉඩම් දත්ත බැංකුවක් පිහිටුවීමේ අරමුණු… … … … … … 48
තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය… … … … … 48
ඉඩම් දත්ත බැංකුව සඳහා හඳුනාගත් ඉඩම් වලට අදාළ යෝග්‍ය
භූමි පරිහරණ වර්ග නිර්ණය කිරීම.. .. … … ... ... ... 49
ඉඩම් දත්ත බැංකුවෙහි ඇතුළත් තොරතුරු… … … … … 50

**හතර වන පරිච්ඡේදය**

ඉඩම් පරිහරණ කමිටු… … … … … … … … … 56

හැඳින්වීම… … … … … … … … … … 56

ජාතික ඉඩම් පරිහරණ සැළසුම් මෙහෙයුම් කමිටුව… … … … … 56

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටුව… … … … … … 57

ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් කමිටුව… … … … … … 59

ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව... ... ... ... ... 61

**පස්වන පරිච්ඡේදය**

ඉඩම් පරිහරණ සැලසුම් කරණය සඳහා භාවිතා කරනු ලබන මෙවලම් හා උපකරණ... ... 62

භූගෝල විද්‍යා තොරතුරු පද්ධති (Geographical Information System – GIS)... ... 62

ජී.පී.එස්. උපකරණ (Global Positioning System)... ... ... ... ... 63

පාංශු උපකරණ... ... ... ... ... ... ... ... ... 64

අනෙකුත් උපකරණ සහ මෙවලම්... ... ... ... ... ... ... 64

පරිශිෂ්ටය... ... ... ... ... ... ... ... ... ... ... 66

ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණ සැළසුම්කරණය සංවර්ධනය හා කළමනාකරණ පිළිබඳ ව්‍යවස්ථාපිත නීති රීති... ... ... ... ... ... ... ... 66

## <u>වගු ලැයිස්තුව</u>

පිටු අංකය

වගුව 1.1 ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා ලබා දිය හැකි නිර්දේශ ... ... ... 19
වගුව 1.2 භූමි භායනයට බලපෑහැකි හේතු සහ ඒ සඳහා යෙදිය හැකි ප්‍රධාන තාක්ෂණික උපක්‍රම 25
වගුව 2.1: භූමි ශක්‍යතා පන්ති සහ ඒවායේ ශක්‍යතාවය... ... ... ... ... ... 28
වගුව 2.2 භූමි යෝග්‍යත වර්ගීකරණය... ... ... ... ... ... ... ... 33
වගුව 2.3 කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් යෝග්‍යතාව හදුනා ගැනීම... ... ... ... 43
වගුව 2.4 පදිංචිය සඳහා ඉඩම් යෝග්‍යතාව හඳුනා ගැනීම ... ... ... ... ... 44
වගුව 2.5 කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා ඉඩම් යෝග්‍යතාව හඳුනා ගැනීම... ... ... 45

<u>රූප සටහන් ලැයිස්තුව</u>

රූප සටහන 2.1: භූමි පැතිකඩක දල වශයෙන් ශක්‍යතා පන්ති වෙන් කර ඇති ආකාරය ... 28
රූප සටහන 2.2: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව පළමු පන්තියේ ඉඩමක් (ගම්පහ දිස්ත්‍රික්කය) 29
රූප සටහන 2.3: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව දෙවන පන්තියේ ඉඩමක් (මාතලේ දිස්ත්‍රික්කය) 29
රූප සටහන 2.4: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව තෙවන පන්තියේ ඉඩමක් (ගම්පහ දිස්ත්‍රික්කය) 30
රූප සටහන 2.5: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව හයවන පන්තියේ ඉඩමක් (අනුරාධපුර දිස්ත්‍රික්කය)... ... ... ... 30
රූප සටහන 2.6: භූමි කොටසක ඡායාරූපයක් සහ භූ විෂමතාවය අනුව භූමි ඒකක දල වශයෙන් වෙන් කර ඇති ආකාරය පැහැදිලි කිරීමක් 32
රූපසටහන 2.7: ඉහත 2.6 ඡායාරූපයේ වෙන් කරන ලද භූමි ඒකක පැතලි තලයක (කඩදාසියක) නිරූපනය කර ඇති අයුරු. 32

## පළමු පරිච්ඡේදය

# 1. හැඳින්වීම

ජනගහනයේ වර්ධනයත් සමගම මිනිසාගේ අවශ්‍යතාවයන් සහ අරමුණු වල ඇතිවන වර්ධනය නිසා භූමිය සීමිත සම්පතක් බවට පත්ව ඇත. විවිධ අවශ්‍යතාවයන් සඳහා භූමිය කෙරෙහි ඇතිවන ඉල්ලුම තුලින් වඩාත් උචිත පරිහරණය හඳුනා ගැනීමත්, දැනට පවතින අවිධිමත් භූමි පරිහරණය මඟ හරවා ගැනීමත්, පවතින ඉඩම් පරිහරණ ගැටළු නිරාකරණය කර ගැනීමත් කල යුතුව ඇත. මේ සඳහා පදනම වන්නේ භූමි පරිහරණය සැලසුම් කිරීමය. එබැවින් මේ කෙරෙහි දැඩි අවධානයක් යොමු කල යුතුව ඇත. භූමි

පරිහරණය සැලසුම් කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ භූමියේ සහ ජලයේ පවතින විභාවතාවයන් පිළිබඳව, විකල්ප පරිහරණයන් පිළිබඳව සහ ප්‍රදේශයේ පවතින සමාජ ආර්ථික තත්වයන් පිළිබඳව ක්‍රමානුකූල තක්සේරුවක් මගින් වඩාත් උචිත පරිහරණය හඳුනා ගැනීමය. මේ අනුව භූමි පරිහරණය සැලසුම් කිරීමේදී ප්‍රදේශයේ පවතින භෞතික, සමාජ ආර්ථික සහ පරිසරාත්මක සාධක පිළිබඳව අවධානය යොමු කෙරේ.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේදී ලබා ගත් අත්දැකීම් සහ පළපුරුද්දත්, රටේ අවශ්‍යතාත් සැලකිල්ලට ගෙන විවිධ මට්ටම් වලදී සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමේ ක්‍රමවේදයන් නිරන්තරයෙන් වැඩි දියුණු කරන ලදී. මෙලෙස වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් සහ දෙපාර්තමේන්තුවේ නව කාර්යයන් පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එක හා සමාන දැනුමක් ලබා දීම අරමුණු කර මෙයට පෙර සකස් කර තිබූ "ඉඩම් පරිහරණ සැලසුම් මාර්ගෝපදේශ සංග්‍රය" නව සංස්කරණයක් ලෙස සකස් කරන ලදී. මෙම සංස්කරණයේදී පැරණි මාර්ගෝපදේශ සංග්‍රහයේ තිබූ දැනට සිදු නොකරන කාර්යයන් ඉවත් කල අතර, නව කාර්යයන් සහ වැඩිදියුණු කරන ලද ක්‍රමවේදයන් නව සංස්කරණයට ඇතුලත් කරන ලදී.

මේ අනුව මෙහි පළමු පරිච්චේදයෙන් ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ විෂය පථය හා සැලසුම් කටයුතු විස්තර කර ඇත. එමෙන්ම විවිධ මට්ටම් වල සැලසුම් සැකසීමේ ක්‍රමවේදයන්ද විස්තරාත්මකව පෙන්වා දී ඇත. අතිරේකව කරනු ලබන ක්ෂේත්‍ර කටයුතු සඳහා තාක්ෂණික මග පෙන්වීමක්ද මෙම පරිච්චේදයේ දක්වා ඇත. විවිධ අවශ්‍යතා සඳහා භූමිය වෙන් කිරීමේදී භූමි යෝග්‍යතාව නිර්ණය කරන විවිධ ක්‍රම පිළිබඳව දෙවන පරිච්චේදයට ඇතුලත් කර ඇත. තුන්වන පරිච්චේදය මගින් ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සහ එය යාවත්කාලීන කිරීම පිලිබඳ විස්තර ඇතුලත් කර ඇත. හතරවන පරිච්චේදය මගින් විවිධ මට්ටම් වල ඉඩම් පරිහරණ කමිටු පිහිටුවීම සහ ඒවායේ කාර්යභාරය පිළිබඳව පැහැදිලි කර ඇත. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා භාවිතා කල හැකි මෙවලම් පළිබඳව හැඳින්වීමක් පස්වන පරිච්චේදයට ඇතුලත් කර ඇත. මෙයට අමතරව මෙම ග්‍රන්ථයට පරිශිෂ්ටයක් ලෙස ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණ සැලසුම්කරණයට හා ඉඩම් කළමනාකරණයට අදාල නීති රීති වල සම්පිණ්ඩනයක්ද ඉදිරිපත් කර ඇත.

## 2. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හා සැලසුම් කටයුතු.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරීමේදී 2010 මැයි මස 20 දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අංක 1654/21 දරණ ඇති විශේෂ ගැසට් පත්‍රයට අනුව පහත දක්වා ඇති විෂයන්ට අදාල රාජකාරී දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන බව දැනුම් දී ඇත.

1) ශ්‍රී ලංකාව සඳහා සම්මත කරගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සැකසීම.

2) ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැළැස්මක් සැකසීම.

3) සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදිත් භාවිත කිරීමට හැකිවන පරිදි උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.

4) භූමිය පදනම් කරගත් සංවර්ධන සැළසුම් වලදී එම සම්පත් ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ හා නියෝග නිකුත් කිරීම.

5) විද්‍යාත්මක භූමි පරිහරණ සැළසුම්කරණය පිළිබඳ දැනුම, පුහුණුව හා අධ්‍යානය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉහත කරුණු ඉටු කිරීම සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වේ. මෙයට අමතරව අතිරේක කාර්යයන් රාශියක්ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

## 2.1 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන්

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි වේ.

(අ) ප්‍රධාන කාර්යය වශයෙන් ගැනෙන විශාල මට්ටමින් (දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින්) සිදු කරනු ලබන සැලසුම් කටයුතු.

(ආ) අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා මට්ටමින් සිදු කරනු ලබන සැළසුම් කටයුතු.

**(අ) විශාල මට්ටමේ සැලසුම් කටයුතු.**

පළාත්, දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම මෙම යටතට ගැනේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම සහ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම සඳහා දැනට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

**(ආ) කුඩා මට්ටමින් සිදු කරනු ලබන සැළසුම් කටයුතු.**

මේ යටතේ තෝරාගත් ගම්මාන සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමත් , හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැළසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීමත්, රාජ්‍ය ආයතන හා රජයේ පාසල් ආශ්‍රිතව ඇති භාවිතා නොකර තිබෙන හිස් භූමි ප්‍රදේශ වල ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන ස්ථාපිත කිරීම හා විවිධ රාජ්‍ය ආයතන වල ඉල්ලීම් අනුව භාවිත නොකර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා අධ්‍යයන වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

ඉහත ප්‍රධාන කාර්යන් වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා (1) විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු සඳහා පාදක වන ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම, (2) දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත් කාලීන කිරීම, (3) ඉඩම් ප්‍රශස්ථ ලෙස භාවිත කිරීම සඳහා රාජ්‍ය නිළධාරීන්, පාසැල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම හා (4) ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වාගෙන යාමද මෙම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

## 3.විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනය.

### 3.1.හැඳින්වීම

භූමිය වඩාත් ප්‍රශස්ත ආකාරයට පරිහරණය කිරීමට මග පෙන්වීම ඉඩම් පරිහරණය සැළසුම් කිරීම යන්නෙන් සරළව අදහස් කෙරේ. මෙහිදී පහත සඳහන් මූලධර්ම පදනම් කර ගනිමින් ඉඩම් පරිහරණය සැළසුම් කිරීම කළ යුතුය.

1. කාර්යක්ෂමතාවය
   ඉඩම් සම්පත දැනට භාවිත කරන ආකාරය වෙනස් කිරීම හෝ වැඩිදියුණු කිරීම තුලින් දැනට වඩා වැඩි ප්‍රතිලාභයක් ලබා ගත හැකි විය යුතු වේ.
2. සමානාත්මතාවය
   ඉඩම් පරිහරණ සැළසුම්කරණයට අදාළ සියළු යෝජනා විවිධ වූ සමාජ පන්ති, ජන කොට්ඨාශ හා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සාධාරණ ලෙස ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයක් ලෙසට සකස් විය යුතුය.
3. තිරසාර බව
   භූමි සම්පත් පරිහරණය වර්තමාන මෙන්ම අනාගත පරපුරටද අඛණ්ඩව ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි සිදු කළ යුතු වේ. අනාගත අවස්ථාවන් සඳහා භූමියේ ඵලදායිතා හැකියාව ප්‍රසස්ථ මට්ටමකින් පවත්වාගෙන යාම හෝ හැකිනම් එය වර්ධනය කිරීම සඳහා භූමි කළමනාකරණය සිදු කල යුතු වේ.
4. වෙනත් පරිහරණයන් ආරක්ෂා කල යුතු වේ. යෝජිත පරිහරණය අනෙකුත් භූමි පරිහරණයන්ට අහිතකර බලපෑම් ඇති නොකළ යුතු අතර, ඒවා ආරක්ෂා කිරීමද කල යුතු වේ.
5. සංවර්ධනයේදී වෙනත් කාර්යයන් සඳහා සරු කෘෂිකාර්මික ඉඩම් අවම ප්‍රමාණයක් භාවිතා කල යුතු වේ.
6. භූමි භාවිතයන්ට බලපෑ හැකි විපත් තක්සේරු කර ඒ සඳහා සූදානම්ව සිටිය යුතු වේ.

සැලසුම්කරණයේ අරමුණ අනුව ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනය විවිධ මට්ටම් වලදී සිදු කල යුතුය. පහළ මට්ටම් වලට යාමේදී සැළසුම වඩාත් සවිස්තර වන අතර එය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සැළැස්මක්

බවට පත්වේ. ඉහල මට්ටම් වලදී සකස් කෙරෙන සැළසුම් ප්‍රධාන වශයෙන් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා උපයෝගී කර ගැනේ.

ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනය ප්‍රධාන වශයෙන් මට්ටම් 04ක් යටතේ සිදුකෙරේ.

(අ)ජාතික මට්ටම

(ආ) පළාත් මට්ටම /දිස්ත්‍රික් මට්ටම

(ඇ) ප්‍රාදේශීය මට්ටම

(ඉ) ගම් මට්ටම හෝ ක්ෂුද්‍ර ජල පෝෂක මට්ටම

විවිධ මට්ටම් යටතේ ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීමේදී එක් එක් මට්ටම් සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කුමන අරමුණක් /අරමුණු සඳහාද යන්න මත ක්‍රමවේදයන්හි සහ නිමැවුම් වල වෙනස්කම් දක්නට ලැබේ. එබැවින් මෙම අත්පොතේ දක්වා ඇති උපදෙස් දැනට අප විසින් භාවිත කරනු ලබන ක්‍රමවේදයන් ආශ්‍රයෙන් ඉදිරිපත් කර ඇති අතර එය තවදුරටත් වැඩි දියුණු කිරීමට අවශ්‍යය යෝජනා ඉදිරිපත් කිරීම මගින් මෙම සැළසුම් ඉතා ප්‍රයෝගික සැළසුම් බවට පත් කිරීමට හැකියාව ලැබේ.

## (අ) ජාතික මට්ටම.

ජාතික මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුමක් මගින් ප්‍රතිපත්ති තීරණ ගැනීමට තාර්කික පදනමක් සපයනු ලැබේ. උදාහරණ ලෙස කොපමණ භූමි ප්‍රමාණයක් අලුතින් වී වගාව සඳහා යෙදවිය යුතුද? එම ප්‍රදේශ මොනවද යන්න,මෙවැනි සැලසුමකින් නිර්ණය කල හැකි වේ.නමුත් එවැනි වගාවකට සුදුසු ප්‍රදේශ වල තිබෙන ප්‍රාදේශීය හෝ කට්ටි මට්ටමේ විවිධත්වයන් සැලකිල්ලට ගැනීමක් මෙහිදී සිදු නොවේ.උදාහරණයක් ලෙස අලුතින් වී වගාවට සුදුසු ප්‍රදේශයක් ලෙස මහවැලි සී කලාපය හඳුනා ගැනීමට මෙවැනි සැළසුමක් ඉවහල් වන නමුත් එම කලාපය තුළ තිබෙන ප්‍රාදේශීය විවිධත්වය අනුව කුඹුරු වලට යෝග්‍ය ප්‍රදේශ වෙන්කර දැක්වීමක් මෙම මට්ටමේ සැළසුම් තුළ දක්නට නොලැබේ. එමෙන්ම වෙනත් ඉඩම් පරිහරණයන් සඳහාද ප්‍රතිපත්ති තීරණ ගැනීමට මෙම මට්ටමේ සැළසුම් භාවිත කල හැකි වේ. උදාහරණයක් ලෙස වන ජීවී ආරක්ෂණ කලාපයක් පිහිටුවීමට සුදුසු ප්‍රදේශයක් හඳුනා ගැනීම වැනි කටයුතු දැක්විය හැකිය.

මෙම මට්ටමේදී පිළියෙළ වන සැළසුම් අපහසුවකින් තොරව ප්‍රතිපත්ති තීරකයන්ගේ මේසයන් මත තබා පරීක්ෂා කිරීමට හැකිවිය යුතු වේ. එම නිසා මෙහිදී පිළියෙළ කරන සිතියම් එතරම් විස්තරාත්මක නොවන අතර එහි පරිමාණය 1:500,000 පමණ වේ. මූලික දත්ත එකතු කිරීම 1:250,000 සිට 1:500,000 පමණ පරිමාණයක් සහිත සිතියම් භාවිත කර සිදු කිරීම යෝග්‍ය වේ. පොදුවේ ඉඩම් පරිහරණ සැළසුම් කරණයේදී ඉඩම් පරිහරණයට අදාළ ආයතන අතර සම්බන්ධීකරණයක් තිබිය යුතු වේ. එසේම ජාතික මට්ටමේ සැළසුම්කරණයේ දී පළාත් මට්ටමින් හෝ දිස්ත්‍රික් මට්ටමින් ලබා ගන්නා දත්ත හා තොරතුරු

උපයෝගී කරගනු ලැබේ. ජාතික මට්ටමේ සැළසුමක් සකස් කිරීමේදී තාක්ෂණික කරුණු මෙන්ම අදාළ ආයතන වල අදහස් හා යෝජනාද සැලකිල්ලට බඳුන් කළ යුතු වේ. එබැවින් ඉඩම් සංවර්ධන විෂයට අදාළ අමාත්‍යාංශ වල නියෝජිතයන්ගෙන් සමන්විත අන්තර් අමාත්‍යාංශ කමිටුවක් මගින් ජාතික මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනයට මග පෙන්වීම සිදු කිරීම වඩාත් යෝග්‍ය වේ. කෙසේ වුවද, ජාතික වශයෙන් වන අවශ්‍යතා රාජ්‍ය ප්‍රතිපත්ති මත තීරණය වන බැවින් ජාතික මට්ටමේ සැළැස්මක් සකස් කිරීම ඉතා භාරදූර කාර්යයකි. මෙවැනි සැළැස්මක් සාර්ථක ලෙස සකස් කිරීම සඳහා දේශපාලන නායකත්වයේ දායකත්වයද ඉතා වැදගත් වේ.

## ජාතික මට්ටමේ සැළසුම් සඳහා සපයා ගත යුතු තොරතුරු:

මෙහිදී මුළු දිවයිනේම භෞතික, ආර්ථික සමාජ හා සංස්කෘතික තත්වය පිළිබඳ පහත සඳහන් කරුණු ආවරණය වන ලෙස මූලික තොරතුරු රැස් කරගත යුතුය.

**භෞතික තොරතුරු:-**

1. ප්‍රධාන භූ විෂමතා ලක්ෂණ හා උන්නතාංශය
2. ප්‍රධාන ජාල පෝෂක ප්‍රදේශ
3. ප්‍රධාන පාංශු කලාප ව්‍යාප්තිය
4. ජලවහනය,භූගත ජලය
5. දේශගුණික තොරතුරු (වර්ෂාපතනය,උෂ්ණත්වය,සුළං,වාෂ්පීකරණය යනාදිය)
6. ඉඩම් පරිහරණය
7. වන හා වනජීවී රක්ෂිත
8. ප්‍රධාන වාරිමාර්ග පද්ධති
9. ජෛවීය විවිධත්වය හා පරිසර සංවේදී ප්‍රදේශ
10. ස්වභාවික උපද්‍රවයන්ට ලක්විය හැකි ප්‍රදේශ

**ආර්ථික තොරතුරු :-**

1. ප්‍රධාන සේවා මධ්‍යස්ථාන
2. ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන හා ඒවා නියෝජනය වන ප්‍රදේශ
3. ප්‍රධාන ආර්ථික වැවිලි ගහණ ප්‍රදේශ හා නිෂ්පාදනය
4. විදුලි බල නිෂ්පාදනය හා ධාරිතාවන්
5. ජල සම්පාදනය හා ධාරිතාවන්

6. ආර්ථික වශයෙන් දියුණු කිරීමට විභවතාවයක් ඇති බෝග වර්ග
7. ගුවන් පථ හා ගුවන් තොටුපොළ
8. වරය හා ඒවා භාවිත වන අන්දම යනාදී ආර්ථික ක්‍රියාවලි පිළිබද තොරතුරු
9. කාර්මික කලාප සහ ඒ සඳහා විභවතාවයක් ඇති ප්‍රදේශ
10. සංචාරක ප්‍රදේශ හා සංචාරක කර්මාන්ත වැඩි දියුණු කල යුතු ප්‍රදේශ
11. යටිතල පහසුකම් (මහා මාර්ග ,දුම්රිය මාර්ග,දුරකථන හා වාරිමාර්ග)
12. ආරක්ෂක ප්‍රදේශ හා කලාප

**සමාජ හා සංස්කෘතික තොරතුරු :-**

1. ජන විද්‍යාත්මක තොරතුරු
2. ලෝක උරුමයන් දක්වන ප්‍රදේශ හා සංස්කෘතික වටිනාකමක් ඇති ප්‍රදේශ
3. පුරාවිද්‍යා රක්ෂිත ප්‍රදේශ
4. ආගමික තොරතුරු
5. ජාතික වැදගත්කමක් සහිත ප්‍රදේශ

ඉහත කරුණු වලට අමතරව විවිධ ආයතන මගින් ඔවුන්ගේ අරමුණු ලඟ කර ගැනීම සඳහා ඉදිරි කාල සීමාවට සකස් කර ඇති සැළසුම්ද විමසා බැලීම මගින් ඉදිරි අවශ්‍යතා පිළිබඳව තක්සේරුවක් ලබා ගත හැකි වේ.

## ජාතික මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුමක් සඳහා අවශ්‍ය සිතියම් සකස් කර ගැනීම:

භූගෝල විද්‍යාත්මක දත්ත පද්ධති (G.I.S.) ආශ්‍රයෙන් සිතියම් විශ්ලේෂණය කල හැකි ආකාරයට සිතියම් සකස් කල යුතුය. සිතියම් වල පරිමාණය 1:500,000 හෝ 1:250,000 පමණ වීම වඩාත් සුදුසු වන අතර ප්‍රධාන වශයෙන් පහත සඳහන් සිතියම් සකසා ගත යුතුය.

1. පවත්නා ඉඩම් පරිහරණ
2. භූ විෂමතාවය (බෑවුම් කලාප)
3. ප්‍රධාන පාංශු කලාප
4. වර්ෂාපතනය
5. උෂ්ණත්වය
6. කෘෂි පාරිසරික කලාප
7. ඉඩම් අයිතිය
8. ජන ව්‍යාප්තිය

9. ප්‍රවාහන ජාලය
10. සංරක්ෂිත ප්‍රදේශ (විවිධ අරමුණු යටතේ වෙන් කර ඇති)
11. ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ
12. ස්වාභාවික ආපදා ඇතිවිය හැකි ප්‍රදේශ
13. පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ

**ජාතික මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුමක අන්තර්ගත විය යුතු කලාප :**

ඉහත සඳහන් තොරතුරු ඇතුලත් භූගෝල විද්‍යාත්මක දත්ත පද්ධතියක් විශ්ලේෂණය කිරීම තුලින් ජාතික මට්ටමේදී වැදගත් වන පහත සඳහන් ප්‍රධාන කලාප හඳුනාගත යුතු වේ.

1. ජනාවාස සඳහා සුදුසු ප්‍රදේශ
2. කෘෂිකර්මයට භාවිත වන ප්‍රදේශ ,කෘෂිකාර්මික විභවතාවයක් ඇති ප්‍රදේශ
3. කර්මාන්ත හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා විභවතාවයක් සහිත ප්‍රදේශ
4. ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ (ගංගා ද්‍රෝණි හඳුනා ගැනීම හා ඒවායේ වඩාත් සංරක්ෂණය විය යුතු කලාප හඳුනා ගැනීම)
5. පාරිසරික සංවේදී ප්‍රදේශ /පුරා විද්‍යාත්මක/වනාන්තර/වනජීවී සංරක්ෂිත ප්‍රදේශ
6. සංචාරක කලාප

දැනට භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාව සඳහා භෞතික සැළැස්මක් පිළියෙළ කර ප්‍රකාශයට පත් කර ඇත. එහි විවිධ කලාප හා අනෙකුත් යටිතල පහසුකම් සැළසුම් කල යුතු ආකාරය පිළිබඳ මඟපෙන්වීමක් ඉදිරිපත් කර ඇත. එවැනි ජාතික සැළසුම්ද ඉඩම් පරිහරණ සැළසුම් සඳහා පදනම් කර ගත යුතු වේ.

## (ආ) පළාත් හා දිස්ත්‍රික් මට්ටම

පළාත් හෝ දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණය විය යුතු ආකාරය පිළිබඳ තීරණ ගැනීම සඳහා පදනමක් ලෙස මෙම සැළසුම් සකස් කෙරේ. එබැවින් මෙහිදී ජාතික මට්ටමට වඩා විස්තරාත්මක තොරතුරු එම සැළැස්මට ඇතුලත් කරනු ලැබේ. මෙම සැළැස්ම සඳහා භාවිතා කරන සිතියම් 1:50,000 සිට1:100,000 දක්වා පරිමාණයකට වීම යෝග්‍ය වේ. නමුත් දත්ත එකතු කිරීමේදී 1:10,000 පරිමාණයේ සිතියම් භාවිතා කරන්නේ නම් එය වඩාත් යෝග්‍ය වේ.

බොහෝ විට පළාත් හා දිස්ත්‍රික් මට්ටම් දෙකේ ක්‍රමවේදයේ වැඩි වෙනස්කමක් දක්නට නොලැබෙන අතර එම සැළසුම් වලින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන සුවිශේෂී අරමුණු අනුව ක්‍රමවේදයන්හි සුළු සුළු වෙනස්කම් ඇති වීමට ඉඩ ඇත. එමෙන්ම මෙම ක්‍රමවේදයන් කාලය අනුව ,රාජ්‍ය ප්‍රතිපත්තින් අනුව, සමාජීය වෙනස්වීම් අනුව, නිෂ්පාදන හා සේවා අවශ්‍යතා අනුව වරින්වර වෙනස්වීම්වලට භාජනය වේ. එබැවින් දීර්ඝ කාලයක් සඳහා එකම ක්‍රමවේදයක් භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව වටහා

ගත යුතු වේ. එසේ වුවද ඉඩම් පරිහරණ සැළසුම්කරණයේ මුලධර්ම නොවෙනස්ව පවතින බවත්, සකස් කරනු ලබන ක්‍රමවේදයන් එම මුලධර්මයන් පදනම් කර සිදු කල යුතු බවත් අවබෝධ කර ගත යුතුය.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම සඳහා ප්‍රමුඛතාවය දී ඇති බැවින් දිස්ත්‍රික් මට්ටමේ සැළසුම්කරණයේ ක්‍රමවේදය පමණක් මෙහිදී විස්තර කෙරේ. මෙම ක්‍රමවේදය පොදුවේ අනෙකුත් දිස්ත්‍රික්ක සඳහාද භාවිතා කල හැකි වේ.

## දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම.

දැනට මෙම දෙපාර්තමේන්තුව උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම ආරම්භ කර ඇත. සංහිඳියා කොමිෂන් සභාව ලබා දී ඇති නිර්දේශ මගින් එම දිස්ත්‍රික්ක වල භූමි සම්පත තිරසාර ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම පහසු කරනු වස් ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම හා ඒවා භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කර ඇත. මෙම කාර්යය මෙම දෙපාර්තමේන්තුවට පවරා ඇති අතර දැනට මේ සඳහා ජාතික හා දිස්ත්‍රික් මට්ටම් වල විශේෂඥ කණ්ඩායම් පත් කර ඇති අතර එම කණ්ඩායම් වල සහයෝගය මත මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිළධාරීන් විසින් සැළසුම්කරණයේ මූලික කාර්යයන් ආරම්භ කොට ඇත.

දැනට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම්කරණය සඳහා සකස් කර ඇති ක්‍රමවේදය සංක්ෂිප්තව මෙම අත් පොතෙහි ඉදිරිපත් කර ඇත. මෙම ක්‍රමවේදය අනෙකුත් දිස්ත්‍රික්ක වලටද පොදුවේ භාවිතා කල හැකි වේ. එමෙන්ම මෙම ක්‍රමවේදය ක්ෂේත්‍ර අත්දැකීම් හා එක් එක් දිස්ත්‍රික්ක වල පවත්නා භෞතික හා සමාජ ආර්ථික තත්වය මත තව දුරටත් වැඩි දියුණු කිරීම සිදු කල හැකි වේ.

දැනට දිස්ත්‍රික්කවල ඇති භූමියෙන් 80%-90% ක් පමණ විවිධ කාර්යයන් සඳහා මේවන විටත් භාවිතා කර ඇති බැවින් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම පහසු කාර්යයක් නොවේ. එබැවින් පහත විස්තර කර ඇති ක්‍රමවේදය මගින් දිස්ත්‍රික්ක සඳහා ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම වඩාත් සුදුසු වේ.

මෙවැනි සැලැස්මක මූලික අරමුණ වනුයේ දිස්ත්‍රික්කය තුල සිදුකරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් සඳහා තීරණ ගැනීමේදී වඩාත් තාර්කික ලෙස භූමි සම්පත බෙදා වෙන් කිරීම සඳහා මෙම සැලැස්ම පාදක කර ගැනීමය. එයට අමතරව මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් භූමි සම්පත හායනය වීම වළක්වාලීමත් පාරිසරික ගැටළු අවම කිරීමත් බලාපොරොත්තු වේ.

දිස්ත්‍රික්කයක සමස්ථ භූමි ප්‍රමාණය සැලකූ විට මුළු ප්‍රදේශයම සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමේ හැකියාවක් නැත. බොහෝ විට මෙසේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට හැකියාවක් නැති ප්‍රදේශ වනුයේ විවිධ හේතු නිසා දැනට ආරක්ෂා කර තිබෙන භූමි ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශ දැනට ආරක්ෂා කර ඇති බැවින් එම ප්‍රදේශ සඳහා සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී. එබැවින් එවැනි ප්‍රදේශ

පළමු පියවරේදීම හඳුනාගෙන වෙන් කර ගැනීම සැලසුම්කරණය සඳහා පහසුවක් වේ. මෙසේ වෙන් කරගත් විට ඉතිරිවන බිම් ප්‍රදේශ සඳහා සැලසුම් සකස් කිරීම සිදු කල හැකිය.

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම සකස් කිරීම පියවර කීපයකින් කරනු ලැබේ.

**<u>පියවර 1</u>**

ආරක්ෂා කල යුතු ප්‍රදේශ වෙන් කර සිතියම් ගත කිරීම

මෙලෙස ආරක්ෂා කල යුතු ප්‍රදේශ වන්නේ :

- වන ජීවී රක්ෂිත සහ වන ජීවී මංකඩ
- වන රක්ෂිත
- පුරාවිද්‍යාත්මක සහ ෛඑතිහාසික රක්ෂිත
- තෙත් බිම්
- වැලි කඳු

මෙයට අමතරව පහත දක්වා ඇති ප්‍රදේශ ආරක්ෂා කිරීමට හෝ සංවර්ධන කාර්යයකට යොදා ගැනීමට තීරණය කිරීම පිළිබඳව අදාල ආයතන සහ සියලුම පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර එම ප්‍රදේශ කවර කාර්යයකට යොදා ගත හැකි දැයි තීරණය කල යුතු වේ.

- වන රක්ෂිත තුල අනවසරයෙන් අල්ලා ගෙන ඇති ප්‍රදේශ
- හේන් වගා බිම්
- ජනාවාස සහ වනාන්තර මායිම් අපැහැදිලි නිසා ගැටළු මතුව ඇති ප්‍රදේශ
- වෙරළ ආරක්ෂිත තීරුව

**<u>පියවර 2</u>**

ආරක්ෂා කිරීමට අවශ්‍ය නොවන ප්‍රදේශ ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදිය හැකි වේ.

**(1) වර්තමානයේ භාවිතා කර ඇති බිම්**

**(2) සංවර්ධන කටයුතු සඳහා භාවිතා කල හැකි බිම්**

**වර්තමානයේ භාවිතා කර ඇති බිම්** යටතට පහත කාණ්ඩ ඇතුලත් වේ:

- ගොඩ නැගිලි සහිත ප්‍රදේශ
- ගෙවතු
- කෘෂිකාර්මික බිම්
    - වතු බෝග සහ ක්ෂේත්‍ර බෝග
    - කුඹුරු
- තෘණ බිම්
- ජල ජීවී වගාව සඳහා යොදා ගෙන ඇති බිම්
- කර්මාන්ත සඳහා යොදා ගෙන ඇති බිම්
- සංචාරක කටයුතු සඳහා යොදාගෙන ඇති බිම්

ඉහත කාණ්ඩ වලින් ගෙවතු කාණ්ඩ දෙකකට බෙදිය හැකි වේ.

(අ ) දැනට හොඳ මට්ටමේ පවතින ගෙවතු. මේවා ඒ ආකාරයෙන්ම දිගටම පවත්වාගෙන යා හැක .
(ආ) කිසියම් වැඩි දියුණු කිරීමක් අවශ්‍ය ගෙවතු

මෙලෙස වැඩි දියුණු කිරීමක් අවශ්‍ය ගෙවතු තෝරා ගැනීමේදී පහත නිර්ණායක භාවිතා කල හැක .

(i) ගෙවත්තේ මුළු බිම් ප්‍රමාණයෙන් 50% ක් හෝ එයට වඩා අඩුවෙන් භාවිතා කර ඇති ගෙවතු
(ii) ප්‍රධාන වශයෙන් ගෘහ භාවිතයට පමණක් නිෂ්පාදනය කරන නමුත් වැඩි ඉඩක් සහිත ගෙවතු
(iii) සත්ව පාලනය හඳුන්වා දිය හැකි ගෙවතු

**කෘෂිකාර්මික බිම් යටතේ ඇති වතු වගා හා ක්ෂේත්‍ර බෝග වගා බිම්** ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ග කල හැක.

(අ) වර්තමාන පරිහරණය දිගටම පවත්වාගෙන ය හැකි බිම්.

(ආ) කිසියම් වැඩි දියුණු කිරීමක් අවශ්‍ය බිම්.

(ඇ) කෘෂිකර්මය ඉවත් කල හැකි බිම්

කිසියම් වැඩි දියුණු කිරීමක් අවශ්‍ය බිම් පහත දැක්වෙන නිර්ණායක භාවිතා කර තොරා ගත හැක.

(i) බිමෙන් 70% ට වඩා අඩුවෙන් භාවිත කර ඇති බිම්
(ii) අතුරු බෝග වගාවන් කර නොමැති බිම්
(iii) සත්ව පාලනය හඳුන්වා දී නොමැති බිම්
(iv) ඒ ඒ බෝග සම්බන්ධයෙන් අදාල ආයතන විසින් පෙන්වා දී ඇති සාමාන්‍ය අස්වැන්නට වඩා අඩුවෙන් අස්වැන්න ලැබෙන බිම්

කෘෂිකර්මය ඉවත් කල හැකි බිම් පහත නිර්ණායක භාවිතා කර තොරා ගත හැක.

(i) ගොඩනැගිලි සහිත ප්‍රදේශ සහ සේවා මධ්‍යස්ථාන වලට ඉතා ආසන්න බිම්.
(ii) භෞතිකව පවතින සීමාකාරී සාධක නිසා කෘෂිකර්මයට යෝග්‍ය නොවන බිම්

**කෘෂිකාර්මික බිම් යටතේ ඇති කුඹුරු** කොටස් දෙකකට බෙදිය හැකි වේ.

(අ) ඒ ආකාරයෙන්ම ඉදිරියට වගාකරගෙන යා හැකි කුඹුරු
(ආ) වැඩි දියුණු කිරීමක් අවශ්‍ය කුඹුරු

වැඩි දියුණු කිරීමක් අවශ්‍ය කුඹුරු පහත නිර්ණායක භවිතා කර තොරා ගත හැක.

(i) දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න ට වඩා අඩු අස්වැන්නක් ඇති කුඹුරු
(ii) එක කන්නයක් පමණක් වගා කරන කුඹුරු

මෙම භාවිතා කල බිම් අතුරින් සමහර බිම් දැනට අත්හැර දමා තිබීමට පුළුවන. එවැනි අත්හැර දමා ඇති බිම් කොටස් දෙකකට වර්ග කල හැක.

(1) අත්හරින ලද ජනාවාස
මෙම ජනාවාස නැවත කොටස් දෙකකට බෙදිය හැක.
1.1 යුධමය වාතාවරණය නිසා අත්හරින ලද ජනාවාස
1.2 අනෙකුත් හේතු නිසා අත්හරින ලද ජනාවාස උදාහරණ: සුනාමි , වන අලි තර්ජන

(2) අත්හරින ලද කෘෂිකාර්මික ප්‍රදේශ
මෙවැනි බිම් පෙර තිබු භාවිතය අනුව වර්ග කල හැක.
2.1 වාරි පහසුකම් යටතේ තිබු කුඹුරු
2.2 වර්ෂා පෝෂිත ලෙස වගා කල කුඹුරු
2.3 ගොඩ බෝග වගා තිබු ප්‍රදේශ

එමෙන්ම මෙම බිම් අත්හැර දැමීමට හේතු වූ කරුණු අනුවද වර්ග කල හැකි වේ. උදාහරණ ලෙස ජලය හිඟ කම, වන සතුන්ගේ උවදුරු , ලවණතාවය , අයිතිකරු ඉඩමේ නොමැති වීම යනාදිය . මෙම බිම් නැවත භාවිතා කිරීම සඳහා නිර්දේශ ලබා දිය යුතු වේ.

**<u>පියවර 3</u>**

ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම:
මෙම ඉඩම් පහත දැක්වෙන ඉඩම් වලින් හඳුනාගත යුතු වේ.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු ඉඩම් වලින්
- රජයේ ආයතන සතු ඉඩම් වලින්
- රජයේ භාවිතා කර නොමැති ඉඩම්
- ලඳු කැලෑ

මෙහිදී සියලුම ලඳු කැලෑ තෝරා නොගත යුතු අතර, ජනාවාස වලට, සේවා මධ්‍යස්ථාන වලට සහ කෘෂිකාර්මික බිම් වලට ආසන්නයේ පිහිටි ලඳු කැලෑ තෝරා ගත යුතු වේ.

**<u>පියවර 4</u>**

ඉදිරි සංවර්ධන කටයුතු සඳහා හඳුනාගත් ඉඩම් සඳහා යෝග්‍යතා නිර්දේශ ලබා දීම:
මේ අනුව පහත පරිහරණයන් සඳහා නිර්දේශ ලබා දිය යුතු වේ.

- ජනාවාස
- කෘෂිකර්මය

- o බෝග වගාව
  - o තෘණ බිම්
  - o ජල ජීවී වගාව
- කර්මාන්ත
- සංචාරක කර්මාන්තය
- වනාන්තර

මෙම කාණ්ඩ සිතියම්ගත කිරීමේදී යම් ඉඩමක් හෝ ප්‍රදේශයක් අවම වශයෙන් හෙක්ටයාර් කාලක් හෝ ඊට වැඩිනම් පමණක් සිතියමට ප්‍රදේශයක් ලෙස ඇතුළත් කල හැක . හෙක්ටයාර් කාලට අඩු බිම් සිතියමේ තිතක් ලෙස (point symbol) ලකුණු කිරීම ප්‍රමාණවත් වේ. හැකි සෑම විටම දත්ත එකතු කිරීම 1:10,000 පරිමාණයේ සිතියම් භාවිතා කර එකතු කිරීම තුලින් වඩා නිවැරදි තොරතුරු ඉදිරිපත් කල හැක. එසේ වුවද, පරිහරණයේ පහසුව තකා සැලැස්ම සමග ඉදිරිපත් කරනු ලබන සිතියම් 1:50,000 පරිමාණයට ලබා දීම ප්‍රමාණවත් වේ.

ඉහත ක්‍රමවේදය අනුව සැලැස්ම සකස් කල විට දිස්ත්‍රික්කයේ ඇති මුළු බිම් ප්‍රමාණයම මෙම සැලැස්මෙන් ආවරණය විය යුතු වේ. එම සැලැස්ම මගින් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ප්‍රදේශ මෙන්ම දැනට කෘෂිකාර්මික කටයුත්තකට පරිහරණය කර ඇතත් තව දුරටත් වැඩිදියුණු කල යුතු ප්‍රදේශ පිළිබඳවත් ඒ සඳහා නිර්දේශත් ලබා දේ. අවසන් වශයෙන් මෙම ඉඩම් පරිහරණ සැලැස්මෙන් දිස්ත්‍රික්කය සතුව ඇති මුළු භූමි ප්‍රදේශයම දල වශයෙන් පහත දක්වා ඇති ලෙස වර්ගීකරණය කල හැකි වේ.

1) ආරක්ෂා කර ඇති ප්‍රදේශ.

2) ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ප්‍රදේශ (කෘෂිකර්මය, නිවාස, කර්මාන්ත, සත්ත්ව පාලනය , සංචාරක කටයුතු, ජල ජීවී වගාවන්, වනාන්තර යනාදිය)

3) වැඩි දියුණු කල යුතු ගෙවතු සහ අනෙකුත් කෘෂිකාර්මික ප්‍රදේශ

4) කලින් පරිහරණය කර දැනට අත් හැර දමා ඇති ප්‍රදේශ

මෙම සැලැස්ම සමඟම ඉඩම් සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය නිර්දේශද ලබා දිය යුතු වේ. මෙලෙස භූමිය බෙදා වෙන් කිරීමේදී සහ නිර්දේශ සම්පාදනයේදී සියලුම පාර්ශවකරුවන්ගේ සහාය ලබා ගත යුතු වේ. මෙවැනි වර්ගීකරණයක් භාවිතා කර ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තීරණ ගැනීම ඉතා පහසු වේ.

## (ඇ) ප්‍රාදේශීය මට්ටම

## ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. මෙම කාර්යයෙහි ප්‍රධාන අරමුණ වනුයේ මෙරට භූමි සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය මහ

පෙන්වීම ලබා දීමය. එසේ වුවද බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල භූමි පරිහරණය සලකූ විට කොට්ඨාශයේ භූමියෙන් වැඩි ප්‍රතිශතයක් දනටමත් විවිධ කාර්යයන් සඳහා පරිහරණය කර ඇති බව පැහැදිලි වේ. එබැවින් භූමි පරිහරණයේ විශාල වෙනස්කමක් සිදු කිරීම සඳහා සැලසුම් කිරීම ප්‍රායෝගික නොවන අතර, පවත්නා ඉඩම් පරිහරණයේ අනිවාර්යෙන්ම වෙනස්විය යුතු ප්‍රදේශ ඇත්නම් ඒවා හඳුනා ගැනීමත්, දැනට පවතින ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා නිර්දේශ ලබා දීමත් මෙම සැලසුමක් තුලින් සිදු කිරීමට බලපොරොත්තු වේ. මෙවැනි සැලසුමකින් යම් ප්‍රදේශයක:

(1) ආරක්ෂා කල යුතු හෝ සංරක්ෂණය කල යුතු ප්‍රදේශ පෙන්වා දීම.
(2) භාවිතා නොකර ඇති බිම් තාර්කික ලෙස විවිධ සංවර්ධන කටයුතු සඳහා නිර්දේශ කිරීම.
(3) ඌණ පරිහරණයන් සහිත ප්‍රදේශ වල ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා නිර්දේශ ලබා දීම.
(4) අවිධිමත් පරිහරණයන් වලක්වා ගැනීමට මඟ පෙන්වීම.
(5) පරිහරණයන් දෙකකක් අතර පවතින ගැටුම් අවස්ථා අවම කිරීම සඳහා නිර්දේශ ලබා දීම සිදු කල යුතු වේ.

මෙම ක්‍රමවේදය පහසුව සඳහා පියවර තුනකින් විස්තර කර ඇත.

## <u>පියවර 1:</u>

මෙම පියවරේදී ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රයේ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීමත්, ඒවා සිතියම් ගත කිරීමත්, අදාල දත්ත රැස්කිරීමත් සිදු කරනු ලැබේ.

**ඉඩම් පරිහරණ ගැටළු:**

සාමාන්‍යයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ වල පවතින ප්‍රධාන ඉඩම් පරිහරණ ගැටළු පහත දක්වා ඇත.

(1) ආරක්ෂා කල යුතු හෝ සංරක්ෂණය කල යුතු ප්‍රදේශ එසේ ආරක්ෂා කර හෝ සංරක්ෂණය කර නොතිබීම.
(2) ඉඩම් සඳහා ඉල්ලුමක් තිබුනද, භාවිතයට නොගත් ඉඩම් තව දුරටත් යම් කාර්යයකට යොදා නොගෙන තිබීම.
(3) භාවිතා කර ඇති බිම් වල ඵලදායිතාවය අඩු මට්ටමක පැවතීම.
(4) අවිධිමත් භාවිතයන් නිසා භූමියේ තත්වය පහත වැටීම (භූමි හායනය වීම).
(5) පරිහරණයන් දෙකක් අතර තරඟකාරී තත්වයක් උද්ගත වීම නිසා ගැටුම් කාරී අවස්ථා නිර්මාණය වීම (උදාහරණ ලෙස කෘෂිකාර්මික බිම් සහ ජනාවාස අතර ගැටුම් කාරී අවස්ථාවක් ලෙස අනර්ඝ පොල් හෝ රබර් ඉඩම් ගෙවතු සඳහා කැබලි කිරීම සැලකිය හැක).

කොට්ටාශය තුල මෙම ගැටළු හඳුනාගෙන ඒවා සිතියම් ගත කිරීමත් නිර්දේශ ලබා දීම සඳහා අවශ්‍ය වන අනෙකුත් දත්ත සහ තොරතුරු රැස් කර ගැනීමත් සිදු කල යුතු වේ.

ඉහත ගැටළු හඳුනාගැනීමටත්, සිතියම් ගත කිරීමටත් පහත දක්වා ඇති ක්‍රම සහ මෙවලම් භාවිතා කල හැකි වේ.

(අ) ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්, ගම්වැසියන් සහ මෙවැනි තොරතුරු ලබා ගත හැකි අනෙකුත් ප්‍රධාන පුද්ගලයින් සමග සාකච්ඡා කිරීම.
(ආ) දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන්ගේ, සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන්ගේ සහ ඉඩම් පරිහරණ සැලසුම් සහකාර නිලධාරීන්ගේ ක්ෂේත්‍ර අත්දැකීම් සහ පළපුරුද්ද යොදා ගැනීම.
(ඇ) ලබා ගත හැකි ද්විතියික දත්ත භාවිතා කිරීම.
(ඉ) ජී.පී.එස්. උපකරණ භාවිතා කරමින් සිදු කරනු ලබන ක්ෂේත්‍ර සමීක්ෂණ මගින්.

ඉහත ක්‍රම කිහිපයක් හෝ සියල්ල භාවිතා කර මුලින් දක්වා ඇති ඉඩම් පරිහරණ ගැටළු ක්ෂේත්‍රයේ හඳුනාගෙන සිතියම් ගත කල හැක. මෙම ගැටළු සිතියම් ගත කිරීමේදී 1:10,000 පරිමාණයේ සිතියම් වල

ඒවා ලකුණු කිරීම වඩාත් යෝග්‍ය වේ. එලෙස 1:10,000 පරිමාණයේ සිතියම් නොමැති අවස්ථා වලදී විකල්පයක් ලෙස චන්ද්‍රිකා ඡායාරූප වල මුද්‍රිත පිටපත් හෝ එම ඡායාරූප භාවිතා කර සකස් කරන ලද සිතියම් භාවිතා කල හැකි වේ. මෙම මට්ටමේ සැලසුම්කරණයේදී අවසන් සිතියම් 1:10,000 පරිමාණයෙන් සැකසිය යුතු වේ.
සැලසුම සකස් කිරීම සඳහා අවශ්‍ය වන අනෙකුත් දත්ත සහ තොරතුරු රැස්කිරීම සඳහා මම දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති ආකෘති පත්‍ර භාවිතා කල හැක. මේ අනුව කොට්ඨාශය තුල පවත්නා පහත දක්වා ඇති ප්‍රදේශ සිතියම් ගත කිරීම සිදු කල යුතු වේ.

(අ) දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ
(ආ) ආරක්ෂා කිරීම හෝ සංරක්ෂණය කිරීම සඳහා අලුතින් නිර්දේශ කරනු ලබන ප්‍රදේශ
(ඇ) භාවිතා නොකරන ලද ප්‍රදේශ
(ඉ) ඌණ පරිහරණයෙන් යුත් ප්‍රදේශ
(ඊ) අවිධිමත් පරිහරණයෙන් යුත් ප්‍රදේශ
(උ) ඉඩම් පරිහරණයන් අතර ගැටුම්කාරී තත්වයන් ඇති ප්‍රදේශ.

## (අ) දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ

මෙම ප්‍රදේශ දනටමත් නිත්‍යානුකූලව ආරක්ෂා ඇති නිසා කර ඉඩම් පරිහරණ සැලසුම සකස් කිරීමේදී මෙම ප්‍රදේශය වෙන් කර ඉතිරි ප්‍රදේශය සඳහා සැලසුම සකස් කරනු ලැබේ. එබැවින් කොට්ඨාශය තුල පහත දක්වා ඇති ප්‍රදේශ වෙන් කර සිතියම් ගත කර ගැනීම ගැනීම ප්‍රථමයෙන් සිදු කල යුතු වේ.

- වනජීවී රක්ෂිත හා කොරිඩෝර
- වන රක්ෂිත
- අවශේෂ කැලෑ
- තෘණ බිම්
- පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන
- ස්වාභාවික සෞන්දර්ය අතින් අනූන හෝ වැඩි වටිනාකමකින් යුත් ස්වභාවික ලක්ෂණ සහිත ප්‍රදේශ.
- ජල තල/ තෙත් බිම්
- සංචාරක කටයුතු ප්‍රවර්ධනය කර ඇති ප්‍රදේශ
- වෙරළ ආශ්‍රිත ස්වභාවික පරිසරයන්
- නාගරික වන ගොමු සහ නාගරික උද්‍යාන
- ලංකා විදුලි බල මණ්ඩලය මගින් ගැසට් කර ඇති රක්ෂිත ප්‍රදේශ

ඉහත දක්වා ඇති ප්‍රදේශ වලින් බොහොමයක්ම වෙනත් ආයතන මගින් සකස් කර ඇති තොරතුරු සහ දත්ත උපයෝගී කරගෙන සිතියම් ගත කර ගත හැකි වේ. ඉහත ප්‍රදේශ දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ ලෙස වර්ග කළද සමහරවිට එම ප්‍රදේශ තුල පහත දක්වා ඇති ගැටළු එකක් හෝ කිහිපයක් තිබීමට පුළුවන. එවැනි ගැටළු ඇත්නම් ඒවා හඳුනාගෙන ඒ සඳහා යම් නිර්දේශයක් ලබා දීමට හැකි නම් එලෙස නිර්දේශ ලබා දෙන්න.
දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ වල තිබිය හැකි ගැටළු:

- මායිම් ලකුණු කර නොතිබීම
- අනවසර අල්ලා ගැනීම්
- ගවයන් විසින් අධික ලෙස තණ උලා කෑම නිසා භූමිය ඛාදනය වීම
- යෝග්‍ය නොවූ භාවිතයන් තිබීම
- පරිසර දූෂණය
- ඉඩම් භුක්තියේ ගැටළු

- ඉඩම් භාවිතන් අතර ගැටුම්

දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ සම්බන්ධයෙන් පහත දක්වා ඇති දත්ත එකතු කල යුතු වේ.

- අදාල ග්‍රාම නිලධාරී කොට්ටාශ මොනවාද යන්න
- එම ප්‍රදේශ/ප්‍රදේශය හඳුනාගැනීමේ කණ්ඩාංක
- එම ප්‍රදේශ/ප්‍රදේශය හැඳින්වෙන නම්/නමක් ඇත්නම් එම නම්
- බිම් ප්‍රමාණය දල වශයෙන්
- එම ප්‍රදේශය තුල ඉහත දක්වා ඇති ගැටළු ඇත්නම් ඒවා පිලිබඳ තොරතුරු

## (ආ) ආරක්ෂා කිරීම හෝ සංරක්ෂණය කිරීම සඳහා අලුතින් නිර්දේශ කරනු ලබන ප්‍රදේශ

පහත දක්වා ඇති ප්‍රදේශ ආරක්ෂා කිරීම හෝ සංරක්ෂණය කිරීම සඳහා අලුතින් නිර්දේශ කල හැකි වේ.

- නායයාම් අවදානමක් ඇති ප්‍රදේශ*/**(ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කර ඇති නායයාම් අවදානම් ප්‍රදේශ සිතියම භාවිතා කරන්න)
- කන්න බෝග වගා කරනු ලබන 60% වැඩි බෑවුම් සහිත ප්‍රදේශ**
- දැනට ප්‍රකාශයට පත් කර නැති ජල මාර්ග**, වැව්*, ජල මුලාශ*, ජල උල්පත්*, වලට අදාල රක්ෂිත
- දැනට ප්‍රකාශයට පත් කර නැති පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික ස්ථාන*
- දැනට රක්ෂිත ලෙස හෝ සංරක්ෂණය සඳහා හෝ ප්‍රකාශයට පත් කර නැති ස්වභාවික සෞන්දර්ය අතින් අනුන හෝ වැඩි වටිනාකමින් යුත් ස්වභාවික ලක්ෂණ සහිත ප්‍රදේශ **
- වැවිලි බෝග සහිත වතු ආශ්‍රිතව ඇති වනාන්තර*
- දැනට ආරක්ෂා කර නොමැති තෙත් බිම්*
- දැනට රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර නොමැති එහෙත් ආරක්ෂා කිරීමට අවශ්‍ය වන ජීවී මංකඩ*
- දැනට රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර නැති වැලි කඳු*

(* ආරක්ෂා කිරීම සඳහා නිර්දේශිත ප්‍රදේශ/ ** සංරක්ෂණය සඳහා නිර්දේශිත ප්‍රදේශ)

ඉහත ප්‍රදේශ සම්බන්ධයෙන් පහත සඳහන් දත්ත රැස් කල යුතු වේ.

- ග්‍රාම නිලධාරී කොට්ටාශයේ නම
- නිර්දේශ කරනු ලබන ප්‍රදේශයේ ඛණ්ඩාංක
- ප්‍රදේශයට භාවිතා කරන නම (ඇත්නම් පමණක්)
- බිම් ප්‍රමාණය
- භූමියේ අයිතිය/ භුක්තිය
- පවතින භූමි පරිහරණය/භූමි ආවරණය
- අවට ප්‍රදේශයේ පවතින භූමි පරිහරණය/ භූමි ආවරණය
- භූමියේ බෑවුම
- භූමියේ පෙර පවතී ඉඩම් පරිහරණය
- වෙනත් අදාල තොරතුරක් ඇත්නම් ඒවා.

ඉහත දත්ත පහත ක්‍රම භාවිතයෙන් රැස් කල හැකි වේ.

- ක්ෂේත්‍ර නිරීක්ෂණ /අධ්‍යාන මගින්
- සිතියම් විශ්ලේෂණ මගින්
- ඉඩම් අයිතිකරුවන් සමග සාකච්ඡා කිරීමෙන්
- ඉඩම් භාවිතා කරන්නන් සමග සාකච්ඡා කිරීමෙන්
- ප්‍රශ්නාවලි හෝ පරික්සුම් ලැයිස්තු මගින්

- ප්‍රාදේශීය නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන්
- ගමේ ප්‍රධානීන් සමග සාකච්ඡා කිරීමෙන්
- ද්විතියික දත්ත භාවිතා කිරීමෙන්
- ජී.පී.එස්. උපකරණ /ගුවන් ඡායාරූප/චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන්
- අදාල වෙනත් ආයතන වලින් ලබා ගන්නා තොරතුරු භාවිතයෙන්.

## (ඇ) භාවිතා නොකරන ලද ප්‍රදේශ

මෙම ප්‍රදේශ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සලකා බැලිය හැකි ප්‍රදේශ වේ. මෙවැනි සමහර ප්‍රදේශ විවිධ පුද්ගලයන් විසින් විවිධ භාවිතයන් සඳහා අනවසරයෙන් අල්ලාගෙන තිබීමට පුළුවන. මෙවැනි ප්‍රදේශද භාවිතා නොකළ ප්‍රදේශ ලෙස වර්ග කරන ලද්දේ එවැනි අනවසර අල්ලා ගැනීම් නීත්‍යානුකූල නොවන නිසා යම් සංවර්ධන කටයුත්තකට එවැනි බිම් යොදා ගැනීමට නීතයනුකූල බාධාවක් නොමැති නිසාය. මෙලෙස අනවසර ලෙස අල්ලා ගෙන ඇති බිම් බොහෝ විට හිස් බිම් ලෙස නොපවතින බව ක්ෂේත්‍ර නිරීක්ෂණ වලදී පැහැදිලි වේ. එසේ වුවද, එවැනි බිම් සංවර්ධනය සඳහා යොදාගත හැකි බිම් ලෙස සැලකිය යුතු වේ.

මෙම ප්‍රදේශ සම්බන්ධයෙන් පහත දැක්වෙන දත්තයන් රැස් කල යුතු වේ.

- පිහිටීමට අදාල තොරතුරු (ග්‍රාම නිලධාරී කොට්ඨාශය, ඛණ්ඩාංක යනාදිය)
- බිම් ප්‍රමාණය
- ඉඩම් අයිතිය/භුක්තිය
- පවතින භූමි පරිහරණය/ භූමි ආවරණය
- පෙර පැවති භූමි පරිහරණය/ භූමි ආවරණය
- අවට ප්‍රදේශයේ භූමි පරිහරණය/ භූමි ආවරණය
- භූමියේ බෑවුම
- පස් වර්ගය
- පසේ ගැඹුර
- භූමියේ මතුපිට විසිරි තිබෙන ගල් ප්‍රමාණය
- ජලය ලබා ගත හැකි බව
- ජලවහන තත්වය
- පාංශු වයනය
- පසේ පී.එච්. අගය
- ලවණතාවය (අදාල නම්)
- ඛාදන තත්වය
- ඉඩමට ප්‍රවේශ වීමේ හැකියාව
- යටිතල පහසුකම්
- ඉඩම භාවිතා නොකිරීමට හේතු
- ඉඩම අනවසරයෙන් අල්ලා ගෙන ඇත්නම් එලෙස අල්ලා ගෙන සිටින කාල සීමාව
- වෙනත් අදාල විය හැකි තොරතුරු

## (ඉ) ඌණ පරිහරණයෙන් යුත් ප්‍රදේශ

කෘෂිකාර්මික භුමි මෙන්ම කෘෂිකාර්මික නොවන භුමිද ඌණ පරිහරණයෙන් යුක්ත විය හැක. එබැවින් මෙම භුමි සම්බන්ධයෙන් වන දත්ත වෙන වෙනම එකතු කල යුතු වේ. පහත දැක්වෙන දත්ත මේ ප්‍රදේශ සම්බන්ධයෙන් එකතු කල යුතු වේ.

- ග්‍රාම නිලධාරී කොට්ටාශයේ නම
- ඛණ්ඩාංක
- ඉඩමේ නම
- ඉඩම් අයිතිය
- ඉඩම භාවිතා කර ඇති ස්වභාවය (සම්පුර්ණයෙන් භාවිතා කර ඇත්ද , කලාතුරකින් භාවිතා කරයිද, කොටසක් භාවිතා කර ඇත්ද )
- බිම් ප්‍රමාණය
- දැනට ඇති බෝගය
- ඌන පරිහරණයක් බව සනාථ කල හැකි සාධක (අඩු බෝග ඝනත්වය, අඩු බෝග අස්වැන්න හෝ වෙනත් සාධක)
- ඌන පරිහරණය සඳහා හේතු ( භෞතික සාධක, සමාජ ආර්ථික සාධක හා අනෙකුත් සාධක)

කෘෂිකාර්මික නොවන ඌන පරිහරණයන් සහිත බිම් සඳහා පහත දැක්වෙන දත්ත එකතු කල යුතු වේ. මෙවැනි බිම් බොහෝ විට විවිධ කාර්යයන් සඳහා ගොඩනැගිලි හෝ වෙනත් ව්‍යුහ ඉදි කිරීම සඳහා භාවිතා කර තිබිය හැක. නමුත් සම්පුර්ණ භූමියම මේ සඳහා භාවිතා කර නොමැත. සැලකිය යුතු බිම් ප්‍රමාණයක් භාවිතා නොකර අත්හැර දමා තිබීමට පුළුවන. ගොඩනැගිලි හෝ වෙනත් ව්‍යුහ විසිරි ඇති නිසා භාවිතා නොකර ඇති ප්‍රදේශය “භාවිතා නොකරන ලද බිම්” ලෙස වර්ග කිරීමද කල නොහැකිය. එවැනි බිම් මෙම කාණ්ඩයට අයත් වේ. මෙවැනි ඉඩම් සඳහා පහත තොරතුරු ලබා ගත යුතු වේ.

- ග්‍රාම නිලධාරී කොට්ටාශයේ නම
- ඛණ්ඩාංක
- ඉඩමේ නම
- ඉඩම් අයිතිය
- මුළු බිම් ප්‍රමාණය
- භාවිතා කර ඇති ස්වාභාවය (කොටසක් දැනට අත්හැර ඇත, කලාතුරකින් භාවිතා කරයි හෝ වෙනත් ආකාරයක්)
- භාවිතා කර ඇති මුළු බිම් ප්‍රමාණය
- භාවිතා නොකර ඇති බිම් ප්‍රමාණය

(ඊ) අවිධිමත් පරිහරණයෙන් යුත් ප්‍රදේශ

පහත දක්වා ඇති භාවිතයන් අවිධිමත් ලෙස සලකන අතර, එම පරිහරණයන් විධිමත් පරිහරනයකට වෙනස් විය යුතු වේ.

(i) ජලාශ වල පෝෂක ප්‍රදේශයේ සහ ජල මාර්ග රක්ෂිත වල සිදු කරනු ලබන සංවර්ධන කටයුතු.
(ii) ස්වාභාවික තණබිම් බෝග වගාවන් සඳහා යොදා ගැනීම
(iii) දැඩි ලෙස පාංශු ඛාදනයට ලක්විය හැකි බිම් වල වගා කටයුතු සිදු කිරීම
(iv) කෘෂිකර්මයට වඩාත් යෝග්‍ය බිම් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදා ගැනීම
(v) ලවනතාවයට හා දුර්වල ජලවහනයට හේතුවන ක්‍රියාකාරකම් සිදු කරන ප්‍රදේශ
(vi) යම් විශේෂිත ස්ථානයකට යෝග්‍ය නොවන බෝග එම ස්ථානයේ වගා කිරීම
(vii) අනර්ඝ කෘෂිකාර්මික බිම් පස්, මැටි, බොරළු, මැණික් යනාදිය ලබා ගැනීම සඳහා හැරීම

පහත දැක්වෙන දත්ත අවිධිමත් පරිහරණයන් සම්බන්ධයෙන් එකතු කල යුතු වේ.

- ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම
- ඛණ්ඩාංක
- ඉඩමේ නම
- අවිධිමත් ලෙස පරිහරණය කර ඇති බිම් ප්‍රමාණය
- ඉඩම් අයිතිය
- අවිධිමත් ක්‍රියාකාරකම්
- දැනට තිබෙන වගාව
- පෙර තිබූ පරිහරණය
- අවිධිමත් ලෙස පරිහරණය කර ඇති කාල සීමාව

## (උ) ඉඩම් පරිහරණයන් අතර ගැටුම්කාරී තත්වයන් ඇති ප්‍රදේශ.

ලංකාවේ ඉඩම් පරිහරණයන් අතර ගැටුම්කාරී තත්වයන් සලකු විට පහත දක්වා ඇති පරිහරණයන් අතර පවතින තරගකාරී තත්වය / ගැටුම් ප්‍රධාන වේ.

(i) වනාන්තර හා කෘෂිකාර්මික කටයුතු
(ii) වනාන්තර හා ජනාවාස
(iii) කෘෂිකර්මය හා නාගරීකරණය
(iv) කෘෂිකර්මය හා ජනාවාස
(v) කෘෂිකාර්මය හා තෘණ බිම් (සත්ව පාලනය)

නිශ්චිත ලෙස මෙම ගැටුම් තිබෙන ප්‍රදේශ සිතියමක දැක්වීම අපහසු බැවින් අදාල පරිහරණයන් දෙක වෙන්වෙන රේඛාවේ සිට දෙපැත්තට යම් ප්‍රදේශයක් අඳුරු කර දැක්වීම ප්‍රමාණවත් වේ. එමගින් අදාල පරිහරණයන් අතර ගැටුම් අවස්ථාවක් ඇති බව විදහා දැක්වේ. කෙසේ වුවද, මෙවැනි ගැටළු විසඳීමට ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තීරණ අවශ්‍ය වන බැවින් ප්‍රාදේශීය මට්ටමේදී මේ සඳහා නිර්දේශ ලබා දීම සමහරවිට දුෂ්කර වේ. නමුත් පාර්ශවකරුවන් අතර සාකච්චේදී වැදගත් නිර්දේශ ඉදිරිපත් වුවහොත් ඒවා සැලැස්මට ඇතුලත් කල හැක.

## <u>පියවර 2</u>

මෙම පියවරේදී හඳුනාගත් ඉඩම් පරිහරණ ගැටළු සඳහා නිර්දේශ සම්පාදනය සිදු කෙරේ. තාක්ෂණික හා සමාජ ආර්ථික කරුණු සලකා බලා පළමුව තාක්ෂණික නිලධාරීන් විසින් අදාල ගැටළු සඳහා නිර්දේශ සකස් කල යුතු වේ. දෙවනුව මෙම නිර්දේශ පාර්ශවකරුවන්ගේ සාකච්ඡාවේදී සියලුම පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස්ද ලබා ගත යුතු වේ. පාර්ශවකරුවන් වෙත අදාල ගැටළු සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී සිතියම්, වගු, ප්‍රස්ථාර, වැනි දෑ භාවිතා කිරීමෙන් වඩාත් පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම කල හැක. මෙහිදී ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සඳහා සංශෝධන සැමගේ එකඟතාවය මත සිදු කල හැක.

නිර්දේශ පිළියෙළ කිරීමේදී පහත දක්වා ඇති උපදෙස් උපකාරී කර ගත හැක.

වගුව 1.1: ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා ලබා දිය හැකි නිර්දේශ

| **ඉඩම් පරිහරණ ගැටලුව** | **ලබා දිය හැකි නිර්දේශය** |
|---|---|

<table>
<tr><td colspan="2">1) දැනටමත් ආරක්ෂා කර ඇති ප්‍රදේශ</td><td>මෙවැනි ප්‍රදේශ සඳහා පහත නිර්දේශ තුනෙන් යෝග්‍ය නිර්දේශ/නිර්දේශය ලබා දිය හැක.<br>(අ) එම් ප්‍රදේශය සම්පූර්ණයෙන්ම (100%) ආරක්ෂා කල යුතු බවට නිර්දේශ කිරීම.<br>(ආ) සමහර පරිහරනයන්ට පමණක් අවසර ලබා දිය හැකි යැයි නිර්දේශ කිරීම.<br>(ඇ) වඩාත් උචිත පරිහරණය නිර්දේශ කිරීම.</td></tr>
<tr><td colspan="2">2) ආරක්ෂා කිරීම සඳහා හෝ සංරක්ෂණය සඳහා අලුතින් යෝජනා කරනු ලබන ප්‍රදේශ</td><td>ඉහත නිර්දේශ තුනම භාවිතා කල හැක.</td></tr>
<tr><td colspan="2">3) දැනට පරිහරණය කර නොමැති භූමි</td><td>මෙම ප්‍රදේශ සම්බන්ධයෙන් යෝග්‍යතා අධ්‍යනයක් සිදු කර පහත පරිහරණයන්ගෙන් එකක් හෝ කිහිපයක් සඳහා නිර්දේශ කරන්න<br>-කෘෂිකර්මය සඳහා<br>-සත්ත්ව පාලනය<br>- නිවාස<br>-කර්මාන්ත<br>-සේවා<br>- වෙනත්</td></tr>
<tr><td></td><td>ඌන පරිහරණයක් සහිත වීමට හේතු</td><td>ලබා දිය හැකි නිර්දේශය</td></tr>
<tr><td rowspan="9">4) ඌන පරිහරණයන් සහිත ප්‍රදේශ</td><td>ප්‍රපාතාකාර බෑවුම්</td><td>සංරක්ෂණ ක්‍රම සහිතව වනාන්තර ඇති කිරීම</td></tr>
<tr><td>භූමිය හායනයට පත්ව තිබීම</td><td>සංරක්ෂණ ගොවිතැන ප්‍රවර්ධනය කිරීම/අවශ්‍ය යෙදවුම් ලබා දීම</td></tr>
<tr><td>ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම</td><td>ජල සංරක්ෂණය ප්‍රවර්ධනය හා වාරි ගැටළු විසඳීම</td></tr>
<tr><td>දුර්වල ජල වහනය</td><td>ජල වහනය වැඩි දියුණු කිරීම/දුර්වල ජලවහන තත්වයට යෝග්‍ය පරිහරණයන් හඳුන්වා දීම</td></tr>
<tr><td>භූමිය ගල් සහිත වීම</td><td>යෝග්‍ය පරිහරණයන් හඳුන්වා දීම</td></tr>
<tr><td>ප්‍රාග්ධනය නොමැති වීම</td><td>කෘෂි ණය/ සහනාධාර ක්‍රම පිලිබඳ දැනුවත් කිරීම</td></tr>
<tr><td>ශ්‍රමය හිඟ වීම</td><td>ශ්‍රමය අඩුවෙන් උපයෝගී වන බෝග/තාක්ෂණය හඳුන්වා දීම සහ යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම</td></tr>
<tr><td>ඉඩම් භුක්තියේ ගැටළු</td><td>අවස්ථාව අනුව සාකච්චා කර සුදුසු නිර්දේශ යෝජනා කිරීම</td></tr>
<tr><td>බෝග වගාවට සහ ඉඩම් කලමනා කරණයට අදාලව තාක්ෂණික</td><td>දැනුවත් කිරීමේ වැඩ සටහන් හඳුන්වා දීම</td></tr>
</table>

| | | |
|---|---|---|
| ඌන පරිහරණයන් සහිත ප්‍රදේශ | දැනුම අඩු බව | |
| | වන සතුන්ගේ හානි | අවස්ථාව අනුව සාකච්ඡා කර සුදුසු නිර්දේශ යෝජනා කිරීම |
| 5) අවිධිමත් පරිහරණයන් සහිත බිම් | | දැනට ඇති පරිහරණය වෙනස් විය යුතු වේ. තාක්ෂණික සාධක සලකා බලා යෝග්‍ය පරිහරණය හඳුන්වා දිය යුතු වේ. අවසන් තීරණයක් ගැනීම සඳහා පාර්ශවකරුවන් සමග සාකච්ඡා කල යුතුය. |

## පියවර 3

පියවර 1 සහ 2 සම්පූර්ණ කල පසු ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ කොටසක් සඳහා සැලසුම් කිරීම නිම කර ඇත. එසේ වුවද, කොට්ටාශයේ ඉඩම් පරිහරණ ගැටළු නොමැති ප්‍රදේශය තවමත් මෙම සැලැස්ම තුලින් අවධානයට ලක් කර නැත. සමහර විට ඉඩම් පරිහරණ ගැටළු නොමැති ප්‍රදේශයට වැඩි බිම් ප්‍රමාණයක් ඇතුලත් වීමට ඉඩ ඇත. එම ප්‍රදේශය තුල පහත දැක්වෙන පරිහරණයන් තිබිය හැක.

(අ) කෘෂිකාර්මික භාවිතයන් සහිත ප්‍රදේශ
(ආ) සේවා මධ්‍යස්ථාන
(ඇ) නිවස/ජනාවාස
(ඉ) කර්මාන්ත
(ඊ) සංචාරක කටයුතු

(අ) කෘෂිකාර්මික භාවිතයන් සහිත ප්‍රදේශ

තාක්ෂණික සාධක හා ඉඩම් සඳහා පවතින ඉල්ලුම සලකා බලා දැනට පවතින කෘෂිකාර්මික ප්‍රදේශ ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ග කල හැකි වේ.
1) දැනට පවතින කෘෂිකාර්මික පරිහරණය දිගටම පවත්වාගෙන ය හැකි ප්‍රදේශ
2) දැනට පවතින ඉඩම් භාවිතය සම්බන්ධයෙන් ගැටළු පවතින ප්‍රදේශ
3) දැනට පවතින කෘෂිකාර්මික පරිහරණයේ වෙනසක් කල හැකි ප්‍රදේශ (මෙම වෙනස් කිරීම අදාළ ආයතන අනුමත කල යුතු අතරම ඉඩම් පරිහණය කරන්නාට දැනට වඩා ප්‍රතිලාභයක් ලැබිය යුතු වේ)

(ආ) සේවා මධ්‍යස්ථාන

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රකාශයට පත් කර ඇති හෝ ප්‍රකාශයට පත් කිරීමට යෝජිත ප්‍රදේශ එම ආයතනය විසින් සැලසුම් කරන හෙයින් එම ප්‍රදේශ මෙම සැලසුම්කරණයට යොදා නොගන්න. ඉතිරි සේවා මධ්‍යස්ථාන වලින් සංවර්ධනය සඳහා වැඩිම විභවයක් ඇති සේවා මධ්‍යස්ථාන තෝරා ගත යුතු වේ. මෙම තේරීමේදී නිලධාරීන්, ප්‍රාදේශීය ව්‍යවසායකයන් හා පදිංචිකරුවන්ගේ අදහස්ද සලකා බැලිය යුතු වේ. මෙලෙස මධ්‍යස්ථාන හඳුනා ගත් පසු අදාළ සාධක සලකා බලා එම මධ්‍යස්ථාන වල වර්ධනය වීමේ දිශාව හඳුනාගත යුතු වේ. එමෙන්ම එම මධ්‍යස්ථාන වල ඉදිරි පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් හඳුනාගැනීම කල යුතු වේ.

ඉහත පියවර තුනම අවසන් කල පසු එක් එක් පියවරේදී පහත දැක්වෙන නිමැවුම් එලි දැක්වේ.

පියවර 1 - ඉඩම් පරිහරණ ගැටළු විදහා දැක්වෙන සිතියම් සහ එයට අදාල ඉඩම් වපසරියන් දැක්වෙන වගු
පියවර 2 - ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා වන නිර්දේශ
පියවර 3 - ප්‍රධාන ඉඩම් පරිහරණ ගැටළු දක්නට නොලැබෙන ප්‍රදේශය සඳහා වන නිර්දේශ

මෙම නිමැවුම් අදාල සිතියම් සමග වාර්තාවක් ලෙස පිළියෙළ කර ඉදිරිපත් කල යුතු වේ. වාර්තාවේ මූලික ආකෘතිය පහත දක්වා ඇත.
ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තාව පරිච්ඡේද පහකින් යුක්ත වේ.

පලමු පරිච්ඡේදයෙහි පහත දැක්වෙන කරුණු ඇතුලත් විය යුතු වේ.

- හැඳින්වීම සහ අරමුණු
- සැලසුම් කරනු ලබන භූගෝලීය ප්‍රදේශය පිලිබඳ හැඳින්වීමක්
    - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා එහි වපසරිය
    - ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව
    - ජනගහනය
    - භූ විෂමතාවය
    - කෘෂි පාරිසරික කලාපය
    - වර්ෂාපතනය හා අනෙකුත් දේශගුණික කරුණු කෙටියෙන්

දෙවන පරිච්ඡේදයට පහත සඳහන් කරුණු ඇතුලත් කල යුතු වේ.

- හඳුනාගත් ඉඩම් පරිහරණ ගැටළු සිතියම් හා වගු මාර්ගයෙන් පෙන්විය යුතුය.
- අවශ්‍ය නම් ඉතා කෙටි විස්තරයක් එක් එක් ගැටලුව සම්බන්ධයෙන් ලබා දිය හැක.

තෙවන පරිච්ඡේදයේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කල යුතු වේ.

- අදාල ගැටළු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- මෙම නිර්දේශ වගු ලෙස හෝ වෙනත් ක්‍රමයකට ඉදිරිපත් කල හැක.

සිව්වන පරිච්ඡේදයෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කල යුතු වේ.

- මෙම ඉඩම් පරිහරණ සැලැස්ම පාදක කර සකස් කල ක්‍රියාකාරී සැලැස්ම.
- යෝජිත ක්‍රියාකාරකම්.
- ඒවායේ ප්‍රමුඛතාවයන්.
- වගකීම් භාර ආයතන.
- කාල රාමුව.

පස්වන පරිච්ඡේදයට පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතු වේ.

- ඉඩම් පරිහරණ සැලැස්ම මගින් හඳුනා ගනු ලැබූ ව්‍යාපෘති
  මෙලෙස කුඩා ව්‍යාපෘති හඳුනාගැනීම තුලින් ඒවා සඳහා ව්‍යාපෘති වාර්තා පිළියෙළ කර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සිදු කල යුතු වේ. ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් මෙලෙස හඳුනාගන්න ලද ව්‍යාපෘති අනුව සිදු කෙරෙනු ඇත.

ඉහත දක්වා ඇත්තේ මූලික ආකෘතිය වන අතර, විස්තරාත්මක ආකෘතියක් සියලුම දිස්ත්‍රික් කාර්යාල වලට ලබා දී ඇත.

## (ඉ) ගම් මට්ටම හෝ ක්ෂුද්‍ර ජල පෝෂක මට්ටම

මෙහිදී ගම් මට්ටමේ සැලසුම් සකස්කිරීම සඳහා වන මූලික පියවරයන් විස්තර කෙරේ.

(i) මෙහිදී ප්‍රාදේශීය සැලැස්ම සඳහා තෝරා ගත් කොට්ටාශය තුල පිහිටි ගමක් තෝරා ගැනීම වඩාත් පහසුවක් වේ. මෙහිදී ගම තෝරා ගැනීමට පවතින්නාවූ ඉඩම් පරිහරණ ගැටළු සංඛ්‍යාව පදනම් කර ගැනීම සුදුසු වේ. වැඩි ඉඩම් පරිහරණ ගැටළු ඇති ගම පළමුව තෝරා ගත යුතු වේ. එමෙන්ම ගම තෝරා ගැනීමේදී සැලසුම සකස් කිරීම සඳහා ගම් වැසියන්ගේ දායකත්වය ලබා ගත හැකිදැයි සොයා බැලිය යුතු වේ. එලෙස දායකත්වයක් ලබා ගත නොහැකි නම් වෙනත් ගමක් තෝරා ගැනීම සිදු කල යුතු වේ.
(ii) ගම් මට්ටමේ ඉඩම් පරිහරණ කමිටුව ස්ථාපනය කර සැලසුම්කරණය ආරම්භ කරන්න.
(iii) ගම පිලිබඳ අවශ්‍ය දත්ත පද්ධතියක් ගොඩ නගා ගැනීම සිදු කල යුතු වේ. උදාහරණ ලෙස භෞතික ලක්ෂණ, ජනගහන තොරතුරු, ඉඩම් භුක්තියේ ස්වභාවය, ආදායම් රටාව යනාදිය. මෙම තොරතුරු ද්විතියික දත්ත මගින්, ක්ෂේත්‍ර සමීක්ෂණ තුලින් ලබා ගත හැකි වේ.
(iv) පවත්නා ඉඩම් පරිහරණය වෙනස් විය යුතු ප්‍රදේශත්, ඉඩම් පරිහරණයේ වැඩි දියුණු කල යුතු ප්‍රදේශත් හඳුනාගැනීම කල යුතු වේ. මෙහිදී ගම වැසියන්ගේ අවශ්‍යතා හා අදහස් වලට ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු වේ.
(v) ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා ග්‍රාමීය කමිටුව සමග සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කරන්න.
(vi) එමන්ම මෙම කටයුතු දිගටම පවත්වා ගැනීමටත් පසුවිපරම් කිරීමටත් ඉඩම් පරිහරණ කමිටුවට වගකීම් පවරන්න .

සාමාන්‍යයෙන් ගම් වල පවතින ඉඩම් පරිහරණ ගැටළු සලකා බැලීමේදී බොහෝ ගම්වල ඉඩම් පරිහරණයට සම්බන්ධ ගැටලුවක් ලෙස ඉඩම් අයිතියේ /භුක්තියේ පවතින්නාවූ ගැටළු වැඩි වශයෙන් ඉස්මතුවී පෙනේ. උදාහරණ වශයෙන් ඉඩම් වල අයිතිය ලැබී නොතිබීම, බලපත්‍ර වෙනුවට දීමනා පත්‍රයක් නොලැබීම, ඉඩම් වල හිමිකම දරුවනට පැවරීමේ ගැටළු යනාදිය දැක්විය හැක. මෙවැනි ගැටළු ඉඩම් කලමනාකරනයටද ඍජුව හෝ වක්‍රව බලපෑම් ඇති කෙරේ. එසේ වුවද, මෙවැනි ගැටළු ඉඩම් පරිහරණ සැලසුමකින් සම්පූර්ණයෙන්ම විසඳීම දුෂ්කර වේ. එහෙත් මෙම ගැටළු හඳුනාගැනීමත්, අදාල අංශ මේ සම්බන්ධයෙන් දැනුවත් වීමත් සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලියේදී සිදුවේ. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලැස්මකින් ප්‍රධාන වශයෙන් ගම තුල ඇති හිස් ඉඩම් ඇත්නම් ඒ සඳහා යෝග්‍ය පරිහරණයන් හඳුනා ගැනීමත්, ඌන ලෙස පරිහරණය කර ඇති ඉඩම් හඳුනාගෙන ඒවායේ ඵලදායිතාවය ඉහල නැංවීමත්, ස්වභාවික සම්පත් ලෙස සැලකෙන පස, ජලය, වෘක්ෂලතා යනාදිය ආරක්ෂා වන ලෙස නිර්දේශ ලබා දීමත් සිදු කෙරේ. එමෙන්ම මෙහිදී ගමෙහි පවතින යටි තල පහසුකම් වල අඩුපාඩුකම් හඳුනාගැනීමද සිදු කල යුතු අතර, එමගින් අදාළ ආයතන දැනුවත් කර යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීමට හැකිවේ.
මෙම ක්‍රියාවලියේදී පලමුව i සිට vi දක්වා වූ පියවරයන් අනුගමනය කර තෝරා ගත් ගම සඳහා සැලැස්ම සකස් කල යුතු වේ. එම සැලැස්මට ඇතුලත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් සකස් කල යුතු වේ. සමහරවිට මෙම වැඩසටහන් වලින් සමහරක් වෙනත් පාර්ශවකාර ආයතන වල විෂය පථයට අයත් වන්නේ නම් එම ආයතන සම්බන්ධ කරගෙන අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කල යුතු වේ. උදාහරණයක් ලෙස සැලැස්ම මගින් හඳුනාගත් ඌන පරිහරණයෙන් යුතු ඉඩම් සඳහා ඵලදායිතා ප්‍රවර්ධනට අතුරු බෝගයක් ලෙස ගම්මිරිස් හඳුන්වා දීම නිර්දේශ කර ඇත්නම්, ඒ සඳහා වැඩසටහනක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ක්රියාත්මක කිරීම සිදු කල යුතු වේ.

## 4. ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන

ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශනයක ප්‍රධාන අරමුණ වනුයේ ඉඩම් පරිහරණ ගැටළු සඳහා ඉඩම් පරිහරණ සැලැස්මකින් ලබා දෙනු ලබන නිර්දේශ වලින් සමහර නිර්දේශ තෝරා ගත් භූමි ප්‍රදේශයක හෝ භූමි කොටසක ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල ප්‍රජාවට පහසුවෙන් අවබෝධ වන ආකාරයට විදහා දැක්වීමය. උදාහරණ ලෙස ඌන පරිහරණයන් සඳහා ඉඩම් පරිහරණය සූක්ෂම කිරීමේ ක්‍රම මේ තුලින් විදහා දැක්විය හැකි වේ. එමෙන්ම භූමියේ තත්වය පහත වැටීම අවම කිරීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම එකක් හෝ

කිහිපයක් ක්‍රියාත්මක කර පෙන්විය හැකි වේ. මෙම ආදර්ශනයක් තුල ඉඩම් සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා ක්‍රියාත්මක කල හැකි තාක්ෂණික ක්‍රම රාශියක් එක ස්ථානයක විදහා දැක්වීම සිදු කල යුතු වේ. මෙවැනි ආදර්ශනයක් නරඹා ඉඩම් කළමණාකරුවෙකුට තම ඉඩමට උචිත ක්‍රම තෝරා ගැනීමට හැකි විය යුතු වේ. එබැවින් ආදර්ශනයන් සඳහා බිමක් තේරීමේදී ඉඩම් පරිහරණ ගැටළු ඇති බිමක් තෝරා ගැනීම වඩාත් යෝග්‍ය වේ. එමෙන්ම එම බිම ඕනෑම තරාතිරමක පුද්ගලයෙකුට ප්‍රවිෂ්ට වී නැරඹීමට හැකි විය යුතු වේ. එසේම එම ආදර්ශනය තුල බෝග වගාවන් ස්ථාපිත කරන්නේ නම් ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උපදෙස් හා සහයෝගය ලබා ගැනීම සුදුසුය. **<u>මෙහිදී සිහි තබා ගත යුතු වැදගත් කරුණු දෙකකි. පළමුවැන්න මෙම ආදර්ශනය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශනයක් බැවින් සාමාන්‍ය බෝග වගා ආදර්ශනයකින් එය වෙනස් විය යුතු බවයි. දෙවැන්න මෙම ආදර්ශණ ස්ථාපිත කිරීමේදී එම ආදර්ශනය අඛණ්ඩව යම් කාල සීමාවක් ඉදිරියට පවත්වාගෙන යා හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් වේ. එසේ නොවුනහොත් ඉතා කෙටි කලකින්ම ආදර්ශණය අත්හැර දැමීම සිදුවේ.</u>**

ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශනයක මූලික පියවරයන්:

1) ආදර්ශනය ස්ථාපිත කිරීමට අපේක්ෂිත භූමිය තෝරා ගන්න. මෙහිදී ඉහත දක්වා ඇති කරුණු සලකා බැලීම වැදගත් වේ.
2) ආදර්ශනය මගින් විදහා දැක්වීමට අපේක්ෂා කරන්නේ මොනවාද යන්න තීරණය කරන්න.
3) එලෙස තීරණය කල පසු ආදර්ශනය සිදු කරනු ලබන භූමියේ දල සැලැස්මක් සකස් කරන්න.
4) ආදර්ශනය තුල සිදුකරනු ලැබීමට යෝජිත ක්‍රියාකාරකම් හඳුනාගැනීමත්, එම ක්‍රියාකාරකම් සඳහා වෙනත් ආයතන වල පුද්ගලයන්ගේ සහයෝගය අවශ්‍ය නම් එය ලබා ගන්නා ආකාරයත් සාකච්ඡා කර තීරණය කරන්න.
5) ආදර්ශනය ඉදිරියට පවත්වා ගැනීම පිළිබඳව වැඩ පිළිවෙලක් සකස් කරන්න.

## 5. හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය සඳහා වැඩ සටහන් සැකසීම.

ඕනෑම භූමියක් නිසි ලෙස කළමනාකරණය නොකළහොත් එම භූමියේ තත්වය පහත වැටීම නොවැලැක්විය හැකිය. මෙලෙස නිසිලෙස කළමණානොකරනු ලබන කෘෂිකාර්මික භූමිද විවිධ හේතු නිසා නැවත පුනරුත්ථාපනය කල නොහැකි ලෙස තත්වයෙන් පහත වැටීමට හෙවත් භූමිය හායනයට ලක් වීමට ඉඩ තිබේ. මෙහිදී අප සලකා බැලිය යුත්තේ කෘෂිකාර්මික බිම් වල සිදුවන භූමි හායනය නිසා අඛණ්ඩව සිදුවන අස්වැන්න අඩුවීම අවම කිරීම සිදු කල හැකිද යන්න සොයා බැලීමය. වෙනත් බිම් වලත් හායනය සිදුවිය හැකි වුවත් එමගින් නිෂ්පාදනයට බලපෑමක් සිදු නොවන බැවින් ඒ පිළිබඳව සැලසුම් සකස් කිරීම එතරම් ඵලදායි නොවේ.

භූමි හායනයන් සිදුවන ආකාරය අනුව තුන් ආකාරයකට වර්ග කල හැකි වේ.
(1) භෞතිකව සිදුවන හායනය
(2) රසායනික භූමි හායනය
(3) ජීව විද්‍යාත්මක භූමි හායනය

(1) භෞතිකව සිදුවන හායනය
මෙය බොහෝ විට සිදු වන්නේ පාංශු ඛාදනයේ ප්‍රතිඵලයක් ලෙසය. පාංශු ඛාදන ක්‍රියාවලිය නිසා පසේ මතුපිට තට්ටුව සෝදා ගෙන ගොස් වෙනත් ස්ථානයක තැන්පත් වීම සිදුවේ. පසේ යටි ස්තර සාරවත් නොවන බැවින් සහ නැවත පස නිර්මාණය වීමට ඉතාමත් දිගු කාලයක් ගන්නා බැවින් මෙවැනි භූමි වල අස්වැන්න අඛණ්ඩව අඩු වීම සිදුවේ. එබැවින් ගොවීන්ගේ ලාභය අඩු වීම දිගින් දිගටම සිදුවී ගොවි බිම් අත්හැර දැමීමට සිදුවේ.

මෙවැනි භූමි හඳුනාගැනීම තරමක් පහසුය. ඒ සඳහා ප්‍රධාන කරුණු දෙකක් කෙරෙහි අවධානය යොමු කිරීම කල යුතුය.

(අ) වගා බිමෙන් ලැබෙන අස්වැන්න අඩු වීම පිලිබඳ තොරතුරු ලබා ගැනීම

(ආ) භූමිය සෝදා පාලුවට ලක් වන්නේදැයි නිරීක්ෂණය කර බැලීම.

ඒ අනුව එවැනි ප්‍රදේශ ඇත්නම් එම ප්‍රදේශ භූමි හායනය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තෝරා ගත යුතු වේ.

(2) රසායනික භූමි හායනය

රසායනිකව සිදුවන හායනය සමහර විට භෞතික හායනය සමගම බැඳී පවතී. භූමියේ තිබෙන්නාවූ රසායනික සංඝටක (බෝග වගාවට අවශ්‍ය ප්‍රධාන මූල ද්‍රව්‍ය සහ අංශු මාත්‍ර මූල ද්‍රව්‍ය) ඉවත් වීම රසායනික හායනයට ප්‍රධාන හේතුවක් වේ. එයට අමතරව පිටතින් වෙනත් රසායන ද්‍රව්‍ය විශාල වශයෙන් බිම් වල එකතු වීමෙන්ද භූමි හායනය වීමට ඉඩ ඇත. උදාහරණ ලෙස පස තුල ලවන එක් රැස් වීම සහ කර්මාන්ත අපද්‍රව්‍ය ලෙස රසායනික ද්‍රව්‍ය බිම් වලට බැහැර කිරීම් නිසා භූමි හායනය සිදු විය හැකි වේ. භෞතික හායනයේදී සිදුවන පස් සෝදා යාමේදී පසේ ඇති මූල ද්‍රව්‍යද ගසා ගෙන යන බැවින් රසායනික හායනය භෞතික හායනය හා බැඳී පවතී. භෞතික හායනය මෙන් නොව රසායනික හායනය ඍජුව හඳුනා ගැනීම තරමක් අපහසු වේ. සමහරවිට මේ සඳහා රසායනාගාරයක් තුලදී පාංශු විශ්ලේෂණයක් සිදු කර පවතින මූල ද්‍රව්‍ය වල මට්ටම් පිලිබඳ අවබෝධයක් ලබා ගත යුතු වේ.

(3) ජීව විද්‍යාත්මක භූමි හායනය

භූමිය ලෙස අර්ථ දක්වා ඇත්තේ මතුපිට පෙනෙන ප්‍රදේශය පමණක් නොව පස තුල පිහිටි පරිසරය සහ භූමිය හා සම්බන්ධ වායව පරිසරය යන පද්ධති සියල්ලමය. මෙම පද්ධති සියල්ල සමස්තයක් වශයෙන් සලකු විට ඒ තුල විවිධ වෘක්ෂලතා සහ විවිධ ජීවීන් ජීවත් වේ. මෙවැනි ශාක සහ සත්ත්ව විශේෂ යම් භූගෝලීය ප්‍රදේශයකට සුවිශේෂී වන අතර, ඔවුන්ගේ පැවැත්ම භූමියේ තිරසාරත්වය සඳහා ඉතා වැදගත් වේ. භූමිය මතුපිට මෙන්ම පස තුල ඇති මෙවැනි සත්ව හා ශාක විශේෂ විනාශ වී යාම නිසා ජීව විද්‍යාත්මක ලෙස භූමිය හායනය වීමකට ලක්වේ. විශේෂයෙන් විවිධ රසායනිය ද්‍රව්‍ය නිරන්තරව භාවිතා කිරීම නිසාද මෙවැනි තත්වයන් ඇතිවිය හැකි වේ.

ජීව විද්‍යාත්මකව සිදුවන භූමි හායනය හඳුනාගැනීම සඳහා එම විෂයයන් පිළිබඳව නිපුණතාවයක් තිබිය යුතු වේ.

මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන වැඩසටහන් වලදී විශේෂයෙන් සලකා බලනුයේ භෞතිකව සිදුවන භූමි හායනය පිලිබඳවය. එවැනි බිම් ක්ෂේත්‍රයේ හඳුනා ගැනීම තරමක් පහසු වන අතරම ඒ සඳහා පුනරුත්තාපන වැඩසටහන් සකස් කිරීමද අපගේ විෂය පථයට අදාලව සිදු කල හැකි වේ. එබැවින් හායනයට පත් බිම් හඳුනාගැනීම සහ එම බිම් පුනරුත්තාපනය සඳහා වැඩසටහන් සැකසීම භෞතිකව සිදු වන භූමි හායනය පදනම් කර විස්තර කර ඇත. පාංශු බාදනය පිලිබඳව මෙම පරිච්ඡේදයේදී විස්තර නොකරන අතර, ඒ සම්බන්ධ විස්තරයක් වෙනම පරිශිෂ්ටයක් ලෙස ඉදිරිපත් කර ඇත.

**<u>මෙහිදී වැදගත් වන්නේ හායනයට පත් භූමි නිවැරදිව හඳුනා ගැනීමත්, හායනය අවම කිරීම සඳහා නිවැරදි ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමත්ය.</u>**

වගුව 1.2 භූමි හායනයට බලපෑහැකි හේතු සහ ඒ සඳහා යෙදිය හැකි ප්‍රධාන තාක්ෂණික උපක්‍රම

| හායනය සඳහා බලපෑ හේතු | තාක්ෂණික උපක්‍රම |
|---|---|
| පාංශු ඛාදනය | <u>ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම:</u><br>- අවම බිම් සැකසුම<br>- වසුන් දීම<br>- සමෝච්ච වගාවන් කිරීම<br>- තීරු ලෙස බෝග වගා කිරීම<br>- දෙවැටි ක්‍රමය  අනුගමනය කිරීම<br>- බහු ස්තර බෝග වගාව<br>- බෝග මාරුව<br>- කෘෂි වන වගාව<br>- කාබනික පොහොර භාවිතය<br><br><u>ඉංජිනේරු/භෞතික ක්‍රම:</u><br>- ගල් වැටි<br>- පස් වැටි<br>- බැංකු මළු<br>- අඟුල් සහ පිටාර කානු |
| ලවණතාවය නිසා හානියට පත් ප්‍රදේශ | කුඹුරු සඳහා:<br>- ජලවහනය දියුණු කිරීම තුලින් වැඩි පුර ඇති ලවන සෝදා යැවීම<br>- වර්ෂා ජලය කුඹුරේ එකතු කර එය පිට කර යැවීමෙන් ලවන සෝදා යැවීම<br>- කුඹුරු නිසිලෙස පෝරු ගා ජලය තැන් තැන් වල නොරැදෙන ලෙස මට්ටම් කිරීම<br>- කිවුල් ඇල නිසි ලෙස නඩත්තු කිරීම<br>- ලවනතාවයට ඔරොත්තු දෙන වී වර්ග වගා කිරීම<br>- කාබනික පොහොර භාවිතය<br>ගොඩ ඉඩම් සඳහා:<br>- ජිප්සම් සහ කාබනික පොහොර භාවිතය<br>- ලවනතාවයට ඔරොත්තු දෙන බෝග තෝරා ගැනීම. |

ගම මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම්, ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශණ සහ හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය යන කාර්යයන් සියල්ල ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම්කරණය හා සම්බන්ධතාවයක් දක්වයි. මෙම කුඩා පරිමාන සැලසුම් සකස් කිරීම සඳහා බිම් තෝරා ගැනීමේදී ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම උපයෝගී කර ගැනීමේ හැකියාවක් ඇත. එබැවින් මෙම ක්‍රියාකාරකම් සියල්ල එකිනෙක හා බැඳුනු ක්‍රියාකාරකම් මිස එකිනෙකින් ස්වායක්ත ක්‍රියාකාරකම් නොවන බව අවබෝධ කර ගත යුතු වේ.

## දෙවන පරිච්ඡේදය

## 02. භූමි යෝග්‍යතා නිර්ණය කිරීම

යම් භූමියකට කුමන පරිහරණයක් වඩාත් යෝග්‍ය දැයි නිර්ණය කිරීම ඉඩම් පරිහරණ සැලසුම්කරණයේ ප්‍රමුඛ කාර්යයකි. මේ සඳහා ක්‍රම කිහිපයක් ඇති අතර, ඒවා පිළිබඳ විස්තරයක් මෙම පරිච්ඡේදයේදී ඉදිරිපත් කෙරේ. මේ පිළිබඳව න්‍යායාත්මකව ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රයෝගිකව අත්හදා බලා තවදුරටත් තම දැනුම දියුණු කර ගැනීම සිදු කර ගත යුතු වේ.

සාමාන්‍යයෙන් හිස් බිම් ප්‍රදේශයක් පහත දක්වා ඇති පරිහරණ එකකට හෝ කිහිපයකට භාවිතා කල හැකි වේ.

- කෘෂිකර්මය සඳහා
- සත්ත්ව පාලනය සඳහා
- නිවාස සඳහා
- කර්මාන්ත සඳහා
- සංචාරක කටයුතු සඳහා
- සේවා මධ්‍යස්ථාන සඳහා
- වනාන්තර හෝ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා

ඉහත දක්වා ඇති පරිහරණ එකක් හෝ කිහිපයක් සඳහා භූමියක යෝග්‍යතාවය නිර්ණය කිරීම විද්‍යාත්මක පදනමක් මත අනෙකුත් සාධකද සලකා බලා තීරණය කල යුතු වේ. ඉහත දක්වා ඇති පරිහරණයන් සැලකූ විට එම පරිහරණයන් සඳහා යම් භූමි කොටසක /භූමි ප්‍රදේශයක එම පරිහරනයන්ට සුදුසු තත්වයන් තිබිය යුතු වේ. උදාහරණ ලෙස වැඩි බෑවුම් සහිත බිමක් වනාන්තර වලට යොදා ගත හැකි වුවත් එය නිවාස වලට හෝ කෙටි කාලින බෝග වගා කිරීමට යෝග්‍ය නොවේ. ඒ අනුව යම් භූමි ප්‍රදේශයක පවතින තත්වය අධ්‍යනය කිරීම තුලින් එම භූමි ප්‍රදේශයට යෝග්‍ය පරිහරණය හඳුනාගැනීමට හැකිවේ.
මෙලෙස භූමි යෝග්‍යතාවය නිර්ණය කිරීමේදී ඉඩම් පරිහරණ මූල ධර්ම සහ ප්‍රතිපත්ති සැලකිල්ලට ගත යුතු වේ. විශේෂයෙන් අනර්ඝ කෘෂිකාර්මික බිම් හැකි තරම් දුරට කෘෂිකර්මය සඳහාම යොදා ගැනීමත් වෙනත් පරිහරණයන් සඳහා ඒවා යොදා ගැනීම අවමව සිදු කිරීමත් ප්‍රධාන ඉඩම් පරිහරණ සැලසුම් මූලධර්මයක් වේ. මෙයට ප්‍රධාන හේතුව වනුයේ කෘෂිකාර්මික බිම් සීමා සහිත ප්‍රමාණයක් තිබීමත්, සෑම බිමකම කෘෂිකාර්මික කටයුතු සිදු කල නොහැකි වීමත් නිසාත්ය. සම්මතව ඇති ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියට අනුව භූමියේ භෞතික යෝග්‍යතාවය අනුව ඉඩම් භාවිතය තීරණය කල යුතු වේ. මේ සියලු කරුණු සැලකූ විට භූමි යෝග්‍යතා නිර්ණය ඉඩම් පරිහරණ සැලසුම්කරණයේ මූලික අවශ්‍යතාවයක් බව පැහැදිලි වන අතරම, එමගින් ඉඩම් පරිහරණ සැලසුම් මූලධර්ම හා ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමක්ද සිදුවේ.

භූමි යෝග්‍යතා නිර්ණයේදී අවස්ථා දෙකක් දක්නට ලැබේ:

(අ) යම් භූමි ප්‍රදේශයකට කුමන පරිහරණයක් යෝග්‍ය දැයි නිර්ණය කිරීම

මෙහිදී යම් භූමි ප්‍රදේශයකට පරිහරණයන් කිහිපයක් සලකා බලා වඩාත් යෝග්‍ය පරිහරණය තීරණය කිරීම සිදු කෙරේ.

(ආ) නිශ්චිත පරිහරණයකට අදාළ භූමිය යෝග්‍යයි නිර්ණය කිරීම.

මෙම අවස්ථාවේදී සිදු කරනුයේ අප යොදාගැනීමට අපේක්ෂිත පරිහරණය පරික්ෂා කරනු ලබන ඉඩමට යෝග්‍යාදැයි තීරණය කිරීමය. උදාහරණ ලෙස අපට ඉඩමක් පෙන්වා එය තේ වගාව සඳහා සුදුසුදැයි පරික්ෂා කර නිර්දේශ ලබා දෙන ලෙස ඉල්ලීමක් කල හොත් අප සලකා බැලිය යුත්තේ එම නිශ්චිත පරිහරණය සඳහා එය සුදුසුද නුසුදුසුද යන්නය. මෙහිදී වෙනත් පරිහරණයන් ගැන සලකා බැලීමක් සිදු නොවේ. මැතකදී මෙම දෙපාර්තමේන්තුවෙන් උක් වගාව සඳහා සුදුසු ඉඩම් ඇත්නම් ඒවා සඳහා යෝග්‍යතා වාර්තා ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර, එහිදී නිර්ණය කරනු ලැබුයේ හඳුනාගන්නා ලද ඉඩම් උක් වගාවට යෝග්‍යද නැද්ද යන කරුණ පමණි.
කෙසේ වුවද, ඉහත අවස්ථා අනුව යෝග්‍යතා නිර්ණය ක්‍රමවේදයන්හි වෙනසක් නොමැති අතර, මෙම අවස්ථා දෙකේදීම එකම යෝග්‍යතා නිර්ණය ක්‍රමවේදයන් භාවිතා කරනු ලැබේ.

## 2.1 ඉඩම් ශක්‍යතා අධ්‍යනය තුලින් යෝග්‍යතාවය පිලිබඳ තීරණය කිරීම.

මෙහිදී සරලව ගත් කල ඉඩම් ශක්‍යතාව යනුවෙන් අදහස් කෙරෙනුයේ ඉඩමක පවතින විභවය හෝ හැකියාව ලෙස හැදින්විය හැක. මෙහිදී එක්වරම පැන නඟින ගැටලුව නම් ඉඩමේ/භූමියේ කුමක් සඳහා වන හැකියාවක්ද යන්නය. මෙය සැබවින්ම භූමියක කෘෂිකර්ම කටයුතු සඳහා වන හැකියාව වේ. වෙනත් අයුරකින් පැහැදිලි කලහොත් යම් භූමියක් කොතරම් දුරකට කෘෂිකර්මයට නැතිනම් ගොවිතැනට යොදා ගත හැකි වේද යන්නය. මෙහිදී වෙන් වෙන් වශයෙන් බෝග සඳහා යෝග්‍යතාවය නිර්ණය කිරීමක් සිදු නොකරන අතර, අදාල භූමි ප්‍රදේශය කෘෂිකර්මයට යෝගයද නැද්ද යන්න පමණක් සොයා බැලේ.
මෙය ඉතා සරල ක්‍රමයකින් නිර්ණය කල හැකි වේ. මේ සඳහා භූමියක පවතින ස්ථිර සීමාකාරී සාධක සලකා බැලීමක් සිදුවේ. ස්ථිර සීමාකාරී සාධක යනු ගොවිතැනට බාධා පමුණුවන පහසුවෙන් ඉවත් කල නොහැකි සාධක වේ. උදාහරණ ලෙස ඉඩමේ බෑවුම, මතුපිට ඇති ගල් ප්‍රමාණය, දුර්වල ජලවහනය යනාදිය සැලකිය හැකි වේ. අධික බෑවුම් සහිත සෑම තැනම ගල් විසිරුණු භූමියක් සැලකූ විට එම භූමියේ කෘෂිකාර්මික හැකියාව ඉතා පහල මට්ටමක ඇත. එවැනි භූමියක් කෘෂිකර්මයට යෝග්‍ය නොවේ. එමෙන්ම සමතලා, මනා ජලවහනයකින් යුත්, මතුපිට ගල් නොමැති භූමියක් සැලකූ විට එම භූමියේ කෘෂිකාර්මික ශක්‍යතාවය ඉතා ඉහලය. මෙම දෙකට අතරමැදිව තවත් අවස්ථාවන් සහිත භූමි දක්නට ලැබේ. එබැවින් භූමි ශක්‍යතාව වර්ගීකරණයක් කර භූමිය පන්ති වලට බෙදා ඇත. උදාහරණ ලෙස පළමු පන්තිය, දෙවන පන්තිය , තෙවන පන්තිය යනාදී වශයෙන්. පළමු පන්තියේ ඉඩමක් කෘෂිකාර්මික ශක්‍යතාවය අතින් ඉතා ඉහල වන අතර, පන්තියේ අගය ඉහලට (උදාහරණ: පස්වන පන්තිය, හයවන පන්තිය) යාමේදී කෘෂිකාර්මික ශක්‍යතාවය අඩු වන බව අවබෝධ කර ගත යුතු වේ. එමන්ම කෘෂිකාර්මික ශක්‍යතාවය අතින් ඉහල බිම් වල භෞතික තත්වය සලකූ විට එම බිම් අනෙකුත් පරිහරණයන් වන ජනාවාස, කර්මාන්ත වැනි පරිහරණයන් සඳහාද යෝග්‍ය වේ. එබැවින් පරිහරණයන් අතර තරඟකාරී තත්වයක් ඇති විට වෙනත සාධකද සලකා බලා තීරණයකට පැමිණිය යුතුවේ.
මුලින්ම ක්‍රමානුකූල ලෙස ඉඩම් ශක්‍යතා වර්ගීකරණය කිරීමේ ක්‍රමවේදය බටහිර රට වල සංවර්ධනය කල අතර, එම ක්‍රමවේදයන් සුළු වශයෙන් සංශෝධනය කර හෝ නොකර අනෙකුත් රටවල භාවිතයට

ගැනේ. ඇමෙරිකාවේ සංවර්ධනය කල ක්‍රමවේදයට අනුව ඉඩම් ශක්‍යතා පන්ති 8 ක් පෙන්වා දී ඇත. බ්‍රිතාන්‍ය හා කැනේඩියානු ක්‍රම අනුව ශක්‍යතා පන්ති 7 ක් නම් කර ඇත. පන්ති 8 කට බෙදා ඇති ඇමෙරිකානු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (USDA Classification) සකස් කල ඉඩම් ශක්‍යතා වර්ගීකරණය 2.1 වගුව මගින් පැහැදිලි කර ඇත. මේ අනුව යම් භූමියක භෞතික තත්වය පරික්ෂාකර බලා එම බිම කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව කුමන පන්තියකට අයත් වන්නේ දැයි තීරණය කල හැකි වේ.

මෙවැනි විශ්ලේෂණයක් භූමියේ දක්නට ලැබෙන තත්වය අනුව සිදු කරන බැවින්, ඉක්මනින් හා පහසුවෙන් කල හැකි වේ. එබැවින් භූමි යෝග්‍යතා නිර්ණයේදී පළමුව භූමි ශක්‍යතා වර්ගීකරණයක් සිදු කර කෘෂිකර්මයට යෝග්‍ය බිම් වෙන් කර ගැනීම පහසු වේ. ඉන් පසු අවශ්‍ය නම් කුමන ආකාරයේ කෘෂිකාර්මික කටයුත්තක් කල හැකි දැයි (කුමන බෝගයද එය කුමන පරිමානයකටද යන වග) භූමි ඇගයීමක් මගින් තීරණය කල හැකි වේ. කෘෂිකර්මයට යෝග්‍ය නැති බිම් වෙනත් පරිහරණයන් සඳහා සලකා බැලිය හැකි වේ.

වගුව 2.1: භූමි ශක්‍යතා පන්ති සහ ඒවායේ ශක්‍යතාවය

| ශක්‍යතා පන්තිය | සීමාකාරී සාධක වල ප්‍රබල බව | ශක්‍යතාවය | ඉඩමේ ස්වාභාවය |
|---|---|---|---|
| I | ඉතාමත් අඩුය. නොසලකා හැරිය හැකි තරම් වේ | සාමාන්‍ය ඉඩම් කළමනාකරණ ක්‍රම සමග සියලුම කෘෂිකාර්මික පරිහරණයන් සඳහා යෝග්‍ය වේ. | සමතලා, මනා ජල වහනයකින් යුත් සාරවත් ඉඩම් |
| II | සීමාකාරී සාධක මද වශයෙන් ඇත | සියලුම කෘෂිකාර්මික පරිහරණයන් සඳහා යෝග්‍ය වේ. නමුත් වාර්ෂික බෝග සඳහා මධ්‍යස්ත ලෙස සංරක්ෂණ ක්‍රම භාවිතා කල යුතු වේ. | මද බෑවුමක් සහිත සුළු වශයෙන් ඛාදනය වූ බිම් |
| III | සීමාකාරී සාධක මධ්‍යස්ථ මට්ටමේ ඇත | සියලුම කෘෂිකාර්මික පරිහරණයන් සඳහා යෝග්‍ය වේ. නමුත් වාර්ෂික බෝග සඳහා දැඩි සංරක්ෂණ ක්‍රම භාවිතා කල යුතු වේ. | බෑවුම් සහිත මධ්‍යස්ථ වශයෙන් ඛාදනය වූ බිම් |
| IV | III මට්ටමට වඩා වැඩි වශයෙන් සීමාකාරී සාධක දක්නට ලැබේ. | සියලුම කෘෂිකාර්මික පරිහරණයන් සඳහා යෝග්‍ය වේ. නමුත් වාර්ෂික බෝග දැඩි සංරක්ෂණ ක්‍රම සහිතව කලාතුරකින් වගා කිරීමට උචිතය. | මද ප්‍රපාතාකාර බෑවුම් සහිත මධ්‍යස්ථ වශයෙන් ඛාදනය වූ බිම් |
| V | දැඩි ලෙස සීමාකාරී සාධක දක්නට ලැබේ. | කෘෂිකාර්මික ශක්‍යතාවය අඩුය. බෝග වගා කිරීමට නොහැකි හෝ වගා කලත් හොඳ අස්වැන්නක් බලපොරොත්තු විය නොහැකි වේ. | වගුරු බිම් හෝ නිරන්තර ජල ගැලීම් වලට භාජනය වන නිම්න ප්‍රදේශ. |

| | | | |
|---|---|---|---|
| | | වගා කලත් එසේ කල හැකි වන්නේ සමහර කාල වලදී පමණක් වන අතර, සමහරවිට වී වැනි බෝගයක් හැර වෙනත් වගාවක් කල නොහැක. | |
| VI | දැඩි ලෙස සීමාකාරී සාධක දක්නට ලැබේ. | මධ්‍යස්ථ සංරක්ෂණ ක්‍රම සහිතව තණ වගාව හෝ බහුවාර්ෂික බෝග වගාව. එසේ නොමැතිනම් වන වගාව | මද ප්‍රපාතාකාර බෑවුම් සහිත ගල් සහිත බාදනය වූ බිම් |
| VII | උග්‍ර වශයෙන් සීමාකාරී සාධක දක්නට ලැබේ. | වනාන්තර සඳහා පමණක් යෝග්‍ය වේ. | ප්‍රපාතාකාර, ගල් සහිත බාදනය වූ බිම් |
| VIII | ඉතා උග්‍ර වශයෙන් සීමාකාරී සාධක දක්නට ලැබේ. | රක්ෂිත හෝ වනජීවී කටයුතු සඳහා යෝග්‍ය වේ. | ඉතා පහසුවෙන් විනාශ විය හැකි බිම් |




රූප සටහන 2.1: භූමි පැතිකඩක දල වශයෙන් ශක්‍යතා පන්ති වෙන් කර ඇති ආකාරය



රූප සටහන 2.2: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව පළමු පන්තියේ ඉඩමක් (ගම්පහ දිස්ත්‍රික්කය)



රූප සටහන 2.3: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව දෙවන පන්තියේ ඉඩමක් (මාතලේ දිස්ත්‍රික්කය)



රූප සටහන 2.4: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව තෙවන පන්තියේ ඉඩමක් (ගම්පහ දිස්ත්‍රික්කය)



රූප සටහන 2.5: කෘෂිකාර්මික ශක්‍යතාවය අනුව හයවන පන්තියේ ඉඩමක් (අනුරාධපුර දිස්ත්‍රික්කය)

මෙම ශක්‍යතා අධ්‍යනයේදී ලංකාවේ භූමි වල ස්වභාවය අනුව සලකා බැලිය යුතු ප්‍රධාන සාධක පහත දක්වා ඇත.

(1) භූමියේ බෑවුම , (2) භූමියේ මතු පිට ස්වභාවය (ගල් සහිතද යන වග) (3) ජල වහනය, (4) පාංශු ඛාදන තත්වය, (5) පාංශු ගැඹුර, (6) පසේ යට තද තට්ටුවක් (මුල් වැඩීමට බාධා කරන) තිබේද යන වග, (7) පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව, (8) ජලය ලබා ගත හැකි බව

මෙයින් අදාළ සාධක තෝරා ගෙන ඒ අනුව භූමි ශක්‍යතා වර්ගීකරණයක් කල හැකි වේ.

## 2.1 කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි ඇගයීම

කෘෂිකර්මය සඳහා භූමියක යෝග්‍යතාවය නිර්ණය සඳහා තවත් ක්‍රමයක් වශයෙන් භූමි ඇගයීම භාවිතා කල හැක. භූමි ඇගයීම තරමක් සංකීර්ණ කාර්යයකි. මෙහිදී භූමියේ ඇති ලක්ෂණ හා ගුණාංග සමග බෝග අවශ්‍යතා ගැලපීමක් සිදු කර යෝග්‍යතාවය නිර්ණය කරනු ලැබේ. මෙලෙස සිදු කිරීමේදී ආර්ථික විශ්ලේෂණයක්ද සිදු කර යෝජිත බෝගය වගා කිරීමෙන් ආර්ථික වශයෙන් ලාභයක් අත් වන්නේදැයි සොයා බලා යෝග්‍යතාවය නිර්ණය කල යුතු වේ. සරලව මෙම ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා ආර්ථික විශ්ලේෂණයන් පිලිබඳ පැහැදිලි කිරීමක් මෙහිදී කර නැත.

**භූමි ඒකක වෙන් කිරීම:**

භූමියක සැම කොටසක්ම එක හා සමාන නොවන බව අප සියලු දෙනාම දන්නා කරුණකි. එකම භූමියේ වුවද සමහර ප්‍රදේශ තැනිතලා, මනා ජලවහනයකින් යුත්, සියුම් පසක් සහිත විය හැකි අතරම එම භූමියේම සමහර කොටස් කඳු ගැට සහිත, රළු පසකින් යුත්, ඉක්මනින් වියලෙන ස්වභාවයෙන් යුක්ත විය හැක. මෙලෙස විවිධ ලක්ෂණ වලින් යුත් භූමි කොටස් සඳහා එකම බෝගය යෝග්‍ය නොවේ. එබැවින් භූමි ඇගයීමකදී එය සිදු කරනු ලබන ප්‍රදේශය භූ විෂමතාවය අනුව කුඩා භූමි ඒකක වලට පළමුව බෙදා ගත යුතු වේ. සමහරවිට භූමි ප්‍රදේශය කුඩා නම් සහ එකම ආකාරයේ භූ දර්ශනයකින් යුක්ත නම් (උදාහරණ ලෙස විෂමතාවයක් නැති සම්පූර්ණ තැනිතලා ප්‍රදේශයක්) එම ප්‍රදේශය සඳහා අනු භූමි කොටස් වෙන් කිරීමේ හැකියාවක් නොමැති අතර, එවැනි ප්‍රදේශයකට එකම ආකාරයේ භූමි පරිහරණයක් යෝග්‍ය වේ.
විශාල ප්‍රදේශයක මෙලෙස භූ විෂමතාවය අනුව භූමි කොටස් වෙන් කර ගැනීමට ප්‍රධාන වශයෙන් ගුවන් ඡායාරූප භාවිතා කර කල හැකිවේ. කුඩා භූමි ප්‍රදේශයකට නම් සිතියම් සහ වෙනත් මෙවලම් භාවිතා කර දල වශයෙන් භූ විෂමතාවය අනුව ඒකක වෙන් කර ගත හැකි වේ. මෙලෙස ඒකක වෙන් කිරීමේදී භූමියේ ඇති ස්ථාවර ලක්ෂණ අනුව ඒකක වෙන් කර ගත යුතු වේ. මෙය වඩාත් පැහැදිලි කිරීම සඳහා ඉඩමක සත්‍ය ඡායාරූපයක් 2.6 රූප සටහනෙන් පෙන්වා ඇති අතර, එහි භූ විෂමතාවය අනුව දල වශයෙන් භූමි ඒකක වෙන් කිරීම විදහා දක්වා ඇත. එමෙන්ම එය කඩදාසියක ඇඳි පසු පෙනෙන ආකාරයද 2.7 රූපයෙන් පෙන්වා ඇත. මෙය හුදෙක් පැහැදිලි කිරීම සඳහා කරන ලද නිරූපනයකි. නියම භූමි ඇගයීමකදී පරිමාණයක් ඇතිව සිතියමක් ලෙස භූමි ඒකක සකස් කල යුතු වේ.

භූ දර්ශනයක මෙම ඒකක වල පිහිටීම අනුව එම ඒකක විවිධ භූමි ලක්ෂණ හා ගුණාංග වලින් යුක්ත වේ. උදාහරණ ලෙස 2.6 සහ 2.7 රූප සටහන් සැලකූ විට, එම භූමියේ මුදුන (2.7 රූපයේ අංක 1 වශයෙන් දක්වා ඇති ප්‍රදේශය ) නොගැඹුරු පසකින් යුත් ඉතාමත් ඉක්මනින් පසේ ජලය ඉවත්වන, ගල් සහිත, පාංශු ඛාදනය වැඩි ප්‍රදේශයක් වේ. එම භූමියේම අංක 3 වශයෙන් හඳුන්වා ඇති ප්‍රදේශය මධ්‍යස්ත ගැඹුරකින් යුත් පසක් සහිත, මනා ජල වහනයකින් යුත්, ගල් රහිත, ඛාදනය අඩු ප්‍රදේශයක් වේ. එබැවින් එකම භූමියේ වුවද, භූමි ඒකක වල තිබෙන්නා වූ භූමි ලක්ෂණ හා ගුණාංග අනුව එම ඒකක

වලට යෝග්‍යා බෝගය වෙනස් වේ. එවැනි වෙනස් කම් පිලිබඳ තැකීමක් නොකර සෑම භූමි ඒකකයක් සඳහාම එකම බෝගය තෝරා ගත හොත් ආර්ථික වශයෙන් අලාභයක් මෙන්ම දිගු කාලයක් යාමේදී භූමියේ තත්වය නැවත පුනරුත්ථාපනය කල නොහැකි ලෙස පහත වැටීමකටද ලක්වේ. එබැවින් භූමි ඇගයීමක් කර බෝග තෝරා ගැනීම ඉතා වැදගත් වේ.

.



රූප සටහන 2.6: භූමි කොටසක ඡායාරූපයක් සහ භූ විෂමතාවය අනුව භූමි ඒකක දළ වශයෙන් වෙන් කර ඇති ආකාරය පැහැදිලි කිරීමක්




රූපසටහන 2.7: ඉහත 2.6 ඡායාරූපයේ වෙන් කරන ලද භූමි ඒකක පැතලි තලයක (කඩදාසියක) නිරූපනය කර ඇති අයුරු. ඊතල මගින් බෑවුමේ දිශාව පෙන්වා ඇත.

එසේ වුවද, සෑම අවස්ථාවකදීම මෙවැනි සංකීර්ණ භූමි ඇගයීමක් කිරීම අත්‍යවශ්‍ය නොවන බව සිහි තබා ගත යුතු වේ. උදාහරණ ලෙස භූමි යෝග්‍යතාවය නිර්ණය කිරීමට යෝජිත භූමියේ භූ විෂමතාවයට සමාන භූ විෂමතාවයකින් යුත් යාව පිහිටි භූමියක යම් බෝගයක් ඉතා සාර්ථකව වගා කර ඇත්නම් එම බෝගයම නිර්දේශ කිරීම සඳහා යෝජිත භූමියට භූමි ඇගයීමක් කිරීමේ අවශ්‍යතාවයක් නැත. නමුත් ආගන්තුක බෝගයක් සඳහා නිර්දේශ කරන්නේ නම් භූමි ඇගයීමක් කිරීම සුදුසු වේ. උදාහරණ ලෙස රබර් වගාව සාමාන්‍යයෙන් පැතිරී ඇති තෙත් සහ අතරමැදි කලාපය හැර වියලි කලාපයේ කිලිනොච්චි වැනි දිස්ත්‍රික්ක සඳහා ව්‍යාප්ත කිරීමේ වැඩසටහනක් අදාල ආයතන විසින් මෑත කාලයේදී ක්‍රියාත්මක කරන ලදී. එවැනි අවස්ථාවකදී අවට තිබෙන වගාවන් නිරීක්ෂණය කර රබර් වගාව සම්බන්ධයෙන් තීරණයකට පැමිණීමට නොහැකි වේ. මෙහිදී එවැනි වගාවකට මෙම ප්‍රදේශය සුදුසුද යන්න භූමි ඇගයීමකින් වඩා පහසුවෙන් තීරණය කල හැකි වේ

භූමි යෝග්‍යතා පන්ති (Land Suitability Classes):

යම් බෝගයක් සඳහා සලකනු ලබන භූමියක් යෝග්‍ය හෝ අයෝග්‍ය ලෙස පමණක් ප්‍රකාශ කිරීම සම්පූර්ණ නොවේ. එයට හේතු වනුයේ එම අවස්ථා දෙක අතර තවත් අවස්ථාවන් අනිවාර්යයෙන්ම තිබෙන බැවිනි (උදාහරණ ලෙස මධ්‍යස්තව යෝග්‍ය , ආන්තිකව යෝග්‍ය වැනි අවස්ථා). එබැවින් යෝග්‍යතාවය ප්‍රකාශ කිරීම පන්ති කිහිපයකට වර්ගීකරණය කර ඇත. එම වර්ගීකරණය වගුව 2.2 මගින් පෙන්වා දී ඇත.

වගුව 2.2  භූමි යෝග්‍යතා වර්ගීකරණය

| යෝග්‍යතා පන්තීන් | විස්තරය |
| --- | --- |
| S1 – වඩාත් යෝග්‍යවූ | සැලකිය යුතු ලෙස සීමාකාරී සාධක නොමැති මෙම පන්තියට අයත් වේ. එමන්ම ඉතාමත් සුළු වශයෙන් සීමාකාරී සාධක තිබෙන එහෙත් එමගින් සැලකිය යුතු තරමේ ඵලදායිතාවය හෝ ප්‍රතිලාභ අඩු වීමක් නොවන අතර, එම සීමාකාරී සාධක හේතුවෙන් යෙදවුම් වල කැපී පෙනෙන වැඩි කිරීමක් අවශ්‍ය නොවන්නා වූ බිම්. |
| S2 - මධ්‍යස්ථව යෝග්‍යවූ | මධ්‍යස්ථ ලෙස සීමාකාරී සාධක පවතින භූමි මෙම පන්තියට අයත් වන අතර, මෙම සීමාකාරී සාධක මගින් ඵලදායිතාවය හෝ ප්‍රතිලාභ අඩු වීමක් සිදු වේ. එමෙන්ම යෙදවුම් වැඩිපුර භාවිතා කිරීමක් අවශ්‍ය වේ. එසේ වුවද මෙම භූමි යම් පරිහරණයකට යෙදවීමෙන් සමස්තයක් වශයෙන් යම් වාසි තත්වයක් ලබා ගත හැක. එමනිසා තවදුරටත් මෙම බිම් යම් පරිහරණයකට ආකර්ශනීය වන නමුත්,  S1 පන්තියට වඩා පහත් මට්ටමක පිහිටයි. |
| S3 - ආන්තිකව යෝග්‍යවූ | මෙම භූමි වල සීමාකාරී සාධක වැඩි හෙයින් ඵලදායිතාවය හෝ ප්‍රතිලාභ අඩුවේ. එමෙන්ම යෙදවුම් වැඩියෙන් භාවිතා කිරීමට සිදුවන අතර, එම යෙදවුම් ප්‍රමාණය ලැබෙන ප්‍රතිලාභ සමග ආන්තික ලෙස සාධාරනීකරණය වේ. |
| N1 - දැනට යෝග්‍ය නොවූ | දැනට තිබෙන දැනුම භාවිතා කර සහ එකඟ විය හැකි පිරිවැයක් දරා සීමාකාරී සාධක අවම කල නොහැකි බිම් මෙම පන්තියට අයත් වේ. මෙම සීමාකාරී සාධක බලපෑම ඉතාමත් අධික නිසා එම බිම් ඵලදායි ලෙස භාවිතය අපහසු වේ. තාක්ෂණිකව මෙම බිම් භාවිතා කල හැකි නමුත්, ආර්ථික වශයෙන් ඒවා සුදුසු නොවේ. |
| N2 - ස්ථිරවම යෝග්‍ය නොවූ | සීමාකාරී සාධක ඉතාමත් අධික බිම් මෙම පන්තියට අයත් වන අතර, ඒවා ඉවත් කිරීම හෝ අවම කිරීම අපහසු වේ. ප්‍රපාතාකාර බෑවුම්, ගොහොරු බිම්, ගල් අධිකව ඇති බිම් යනාදිය මේ ගණයට අයත් වේ. |

ඉහත වර්ගීකරණය තව දුරටත් උප පන්තීන්ට සහ ඒකක වලට බෙදිය හැක. මෙම විස්තරය වඩා සංකීර්ණ වන බැවින් එම අනු බෙදීම් මෙහිදී විස්තර නොකෙරේ. යමෙකුට මේ පිළිබඳව තවදුරටත් දැනුම ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ලෝක අහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO, 2007 Land Evaluation)

මේ සම්බන්ධයෙන් ඇති ප්‍රකාශන මෙන්ම අන්තර්ජාලය භාවිතයෙන්ද තොරතුරු ලබා ගත හැකි වේ.
www.**fao**.org/nr/**land**/**land**-policy-and-planning/eval/en

**විවිධ බෝග සඳහා භූමි අවශ්‍යතා:**

විවිධ බෝග වර්ග සඳහා භූමි අවශ්‍යතා එකිනෙකට වෙනස් වේ. උදාහරණ ලෙස තේ බෝගය සඳහා භූමි අවශ්‍යතා පොල් බෝගයේ භූමි අවශතා වලට වඩා වෙනස් වේ. වී බෝගයේ භූමි අවශ්‍යතාවයන් ඉහත බෝග දෙකටම වඩා වෙනස් වේ. එබැවින් මෙම භූමි අවශ්‍යතා දැනගෙන සිටීම භූමි ඇගයීමක පූර්ව අවශ්‍යතාවයකි. බෝග වර්ග කිහිපයකට භූමි අවශ්‍යතා ඩී.එල්. ඩෙන්ට් හා ආර්. බි. රිජ්වේ විසින් 1986 දී සකස් කර ඇති ශ්‍රී ලංකාව සඳහා වූ ඉඩම් පරිහරණ සැලසුම්කරණ අත්පොතෙහි විස්තර කර ඇත. එය සෑම දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයකම ඇති බැවින් අවශ්‍ය විට එම තොරතුරු එමගින් ලබා ගත හැක. මෙහිදී තෝරාගත් එක් බෝගයක් සඳහා පමණක් භූමි අවශ්‍යතා විස්තර කර ඇත. යම් බෝගයකට භූමි අවශ්‍යතා විස්තර කිරීමේදී එම බෝගයට වඩාත් සුදුසු භූමියක තිබිය යුතු අවශ්‍යතා මොනවාද, මධ්‍යස්තව සුදුසු භූමියක තත්වය කෙසේද, ආන්තික භූමියක ලක්ෂණ මොනවාද යන්න පැහැදිලි කර ගත යුතු වේ. යම් බෝගයකට ආන්තිකව සුදුසු භූමියක් වෙනත් බෝගයකට වඩා යෝග්‍ය වීමට ඉඩ ඇති බව මෙහිදී මතක තබා ගත යුතු වේ.

පොල් බෝගය සඳහා භූමි අවශ්‍යතා පහතින් විස්තර කර ඇත.

<u>පොල් සඳහා වඩාත් සුදුසු භූමියක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ</u>

1) භූමිය මුහුදු මට්ටමේ සිට මීටර 300 දක්වා වූ උසකින් පිහිටීම.
2) සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 27 ට වඩා වැඩි වීම.
3) වර්ෂය තුල සූර්යාලෝකය ලැබෙන පැය ගණන පැය 2500 ට වඩා වැඩිවීම.
4) වියලි මාස වලදී අවම ආර්ද්‍රතාවය 85% ක් වීම.
5) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2500 ට වැඩි වීම.
6) පාංශු ගැඹුර සෙන්ටිමීටර් 150 ට වඩා වැඩි වීම.
7) පසේ වයනය මැටි, මැටි ලෝම සහිත සිල්ට් වීම.
8) හොඳ ජල වාහනයේ සිට මධ්‍යස්ථ ජලවහන පරාසයකින් යුක්ත වීම.
9) පාංශු පි.එච්. අගය5.4 සිට 6.5 දක්වා පරාසයක වීම.
10)සමතලා භූමි වල පිහිටි දියළු පස් වර්ගය තිබීම.
11) ලවණතාවය සෙන්ටිමීටරයට මිලි සෙමෙන්ස් 4 ට වඩා අඩු වීම.

12) බෑවුම් ප්‍රතිශතය 16% ට වඩා අඩු වීම.

13) භූමියේ මතුපිට විසුරුණු ගල් නොමැති වීම.

<u>පොල් සඳහා මධ්‍යස්ථව යෝග්‍ය භූමියක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ</u>

1) භූමිය මුහුදු මට්ටමේ සිට මීටර 300-600 දක්වා වූ උසකින් පිහිටීම.

2) සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 26- 27 අතර වීම.

3) වර්ෂය තුල සූර්යාලෝකය ලැබෙන පැය ගණන පැය 2250-2500 ට අතර වීම.

4) වියලි මාස වලදී අවම ආර්ද්‍රතාවය 75- 85% අතර වීම.

5) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2000-2500 අතර වීම.

6) පාංශු ගැඹුර සෙන්ටිමීටර් 100-150 අතර වීම.

7) පසේ වයනය ලෝම, වැලි මැටි, වැලි මැටි ලෝම, මැටි ලෝම, වැලි ලෝම වීම.

8) හොඳ ජල වාහනයේ සිට මධ්‍යස්ථ ජලවහන පරාසයකින් යුක්ත වීම.

9) පාංශු පි.එච්. අගය 6.5-7.0 සහ 5-5.5 දක්වා පරාසයක වීම.

10) පස් වර්ගය මද රැලි බිම වල පිහිටි රතු කහ ලැටසොල් පස, රතු කහ පොඩ්සෝලික පස, රතු දුඹුරු ලැටසොල් පස, ලටසොල් සහ රෙගොසොල් පස .

11) ලවණතාවය සෙන්ටිමීටරයට මිලි සෙමෙන්ස් 4-8 අතර වීම.

12) බෑවුම් ප්‍රතිශතය 16-30 % අතර වීම.

13) භූමියේ මතුපිට විසුරුණු ගල් ප්‍රතිශතය 1-5% අතර වීම.

<u>පොල් සඳහා ආන්තිකව යෝග්‍ය භූමියක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ</u>

1) භූමිය මුහුදු මට්ටමේ සිට මීටර 300-900 දක්වා වූ උසකින් පිහිටීම.

2) සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 23 - 26 අතර වීම.

3) වර්ෂය තුල සූර්යාලෝකය ලැබෙන පැය ගණන පැය 2000 -2250 ට අතර වීම.

4) වියලි මාස වලදී අවම ආර්ද්‍රතාවය 65-75 % අතර වීම.

5) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1300-2000 අතර වීම.

6) පාංශු ගැඹුර සෙන්ටිමීටර් 100-75 අතර වීම.

7) පසේ වයනය ලෝම, වැලි මැටි, වැලි මැටි ලෝම, මැටි ලෝම, වැලි ලෝම වීම.

8) අසම්පූර්ණ ජලවහනයකින් යුක්ත වීම.

9) පාංශු පි.එච්. අගය 7-8 සහ 4.5- 5 දක්වා පරාසයක වීම.

10) පස් වර්ගය කඳුකර රතු කහ පොඩ්සෝලික පස , කඳුකර නොමේරූ දුඹුරු ලෝම පස, ලටසොල් සහ රෙගොසොල් පස .

11) ලවණතාවය සෙන්ටිමීටරයට මිලි සෙමෙන්ස් 8-12 අතර වීම.

12) බැවුම් ප්‍රතිශතය 30-50 % අතර වීම.

13) භූමියේ මතුපිට විසුරුණු ගල් ප්‍රතිශතය 5-15% අතර වීම.

<u>පොල් සඳහා යෝග්‍ය නොවන භූමියක තිබිය හැකි ප්‍රධාන ලක්ෂණ</u>

1) භූමිය මුහුදු මට්ටමේ සිට මීටර 900 ට වැඩි උසකින් පිහිටීම.

2) සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 23 අඩු වීම .

3) වර්ෂය තුල සූර්යාලෝකය ලැබෙන පැය ගණන පැය 2000 ට අඩු වීම.

4) වියලි මාස වලදී අවම ආර්ද්‍රතාවය 65% ට අඩු වීම.

5) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1300 ට වඩා අඩු වීම.

6) පාංශු ගැඹුර සෙන්ටිමීටර් 75 ට අඩු වීම.

7) දුර්වල හෝ ඉතා වැඩි ජලවහනයකින් යුක්ත වීම.

9) පාංශු පි.එච්. අගය 8 ට වැඩි හෝ 4.5 ට අඩු වීම..

10) පස් වර්ගය: සොලඩියිස්ඩ් සොලනේට්ස්, ග්‍රැමොසොල්ස් (නිවර්තන කළු මැටි පස්), කළුකර රතු කහ පොඩ්සෝලික්, හැල් පස්

11) ලවණතාවය සෙන්ටිමීටරයට මිලි සෙමෙන්ස් 12 ට වැඩි වීම.

12) බැවුම් ප්‍රතිශතය 50 % ට වැඩි වීම.

13) භූමියේ මතුපිට විසුරුණු ගල් ප්‍රතිශතය 15% ට වැඩි වීම.

ඉහත ලක්ෂණ/ගුණාංග යම් භූමියක පිහිටා තිබෙන ආකාරය අනුව එම භූමිය පොල් වගාව සඳහා වඩාත් සුදුසුද, මධ්‍යස්තව සුදුසුද, ආන්තිකව සුදුසුද නැතිනම් නුසුදුසුද යන්න තීරණය කල හැකි වේ.
සරලව පැහැදිලි කල හොත් භූමි ඇගයීමකදී බෝගයට හොඳින් වැඩීමට අවශ්‍ය කරන භූමියේ සාධක අදාළ භූමිය සතුව තිබේ දැයි සංසන්දනය කර බැලීමක් සිදුවේ.

මෙලෙස භූමි ශක්‍යතා අධ්‍යනයකින් හෝ භූමි ඇගයීමකින් භූමියක කෘෂිකාර්මික යෝග්‍යතාවය නිර්ණය කලද, එම භූමිය වෙනත් පරිබාහිර හේතු නිසා නිර්ණය කල කාර්යටම වෙන් කල නොහැකි වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් බලපානුයේ සමාජීය සාධකය. උදාහරණ ලෙස නගරයක් සමීපව හොඳ කෘෂිකාර්මික බිමක් තිබුණහොත් එය ඉහත ඇගයීම් ක්‍රම වලින් කෘෂිකර්මයට යෝග්‍ය බව ප්‍රකාශ වුවද, එම ප්‍රදේශයේ ඇති වෙනත් ඉල්ලුම් මත මෙය රෝහලක් ගොඩ නැගීම සඳහා භාවිතා කිරීමට සිදු විය හැක. මෙවන් අවස්ථාවක අනෙකුත් සාධක (පාංශු සාධක හැර) වෙන් වෙන්ව සලකා ඒවා බර තැබීමේ ක්‍රමයක් තුලින් යෝග්‍යතාවය නිර්ණය කල හැකි වේ. මෙම විස්තරය වඩා සංකීර්ණ හා දීර්ඝ වන බැවින්, ඒ පිළිබඳව මෙහිදී විස්තර කර නොමැති අතර, යමෙකුට ඒ පිළිබඳව විස්තර අවශ්‍ය වන්නේනම් අන්තර්ජාලය පරිහරණයෙන් නවතම විස්තර ලබා ගත හැකි වේ (අන්තර්ජාලයට පිවිස "Land Evaluation and Site Assessment" යනුවෙන් සොයා බැලීම තුලින් අදාළ වෙබ් පිටු වලට පිවිසිය හැකි වේ).

අනෙකුත් පරිහරණයන්ට මැදිව පිහිටි කුඩා ඉඩම් සඳහා ශක්‍යතා අධ්‍යනයන් හෝ භූමි ඇගයීම් කිරීම මුදල් හා කාලය වැය වන එතරම් ප්‍රතිඵලයක් නොමැති අභ්‍යාසයකි. එබැවින් එවැනි බිම් වල යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා සංක්ෂිප්ත වඩා පහසු ක්‍රමවේදයන් මෙම දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දී ඇත. ඒ පිලිබඳ විස්තරයක් පහතින් දක්වා ඇත.

## 2.2 ඉඩම් පරිහරණ යෝග්‍යතා වාර්තා

විවිධ භාවිතයන් සඳහා ඉඩම් යොදාගැනීමට පෙර එම ඉඩම් පරික්ෂා කර යෝග්‍යතාවය පිළිබඳ වාර්තා කිරීම ඉඩම් පරිහරණ වාර්තාවක මූලික අරමුණ වේ.පරීක්ෂණයට භාජනය කරන ලද ඉඩම සඳහා සුදුසු විකල්ප පරිහරණයන් හඳුනාගැනීම සඳහා ද මෙම ඉඩම් පරීක්ෂණ වැදගත් වේ. ඉඩම් පරීක්ෂා කිරීමේ දී අවශ්‍ය දත්ත එක් රැස් කිරීම සඳහා භාවිතා කල යුතු ආකෘතියක් පහතින් දක්වා ඇත. මෙහි දී විවිධ කාර්යන් සඳහා ඉඩම් හඳුනා ගැනීමේ නිර්නායක ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී ඉඩම් පරීක්ෂණයේ අරමුණට අදාල නිර්නායක හඳුනාගෙන පරීක්ෂණ වාර්තාව වඩා විද්‍යාත්මක පදනමක් මත සකස් කල යුතුයි.
එම තොරතුරු රැස්කල පසු එකී ඉඩමේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් සැපයිය යුතු අතර එම වාර්තාවේ අඩංගු විය යුතු මූලික කරුණු පිලිබඳ ආකෘතියක්ද පහත ඉදිරිපත් කර ඇත.

**<u>ඉඩම් යෝග්‍යතා වාර්තාවක් සඳහා දත්ත රැස් කිරීමේ ආකෘතිය.</u>**

01. දිස්ත්‍රික්කය ........................................................-:
02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ........................................................-:
03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ........................................................-:
04. ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය :- ........................................................
05. ග්‍රාම නිළධාරී කොට්ඨාශය හා අංකය :- ........................................................
06. ගමේ නම ........................................................ -:
07. ඉඩමේ නම ........................................................ -:
08. පිඹුරුපත් අංකය හා ලොට් අංකය :-........................................................
09. අඟලේ සිතියම් ........................................................ -:
    කෘෂි පාදක1 :50, 000සිතියමේ අංකය ........................................................ -:
    ග්‍රිඩ් අංක ................... උ ...................... නැ -:
10. පරීක්ෂාවට යොමු කළ මුළු බිම් ප්‍රමාණය :- හෙක්ටයාර්/ .......අ.......පර්......රූ.......
11. ඉඩමේ අයිතියභුක්තිය /
    I. පුද්ගලිකදරජයේද / ........................................................ -:
    II. රජයේ නම් අදාළ ආයතනයේ නම ........................................................ -:
12. භෞතික කරුණු
    I. ඉඩමේ උන්නතාංශය මීටර්අඩි / .....................උපරිම ..............අවම -:
    II. භූමියේ ස්වභාවය.................................... (වගුරු වශයෙන් ,රැලිබිමක්,තැනිතලා ,කඳු) -:
    III. බෑවුම් කලාප (තිශතයක් ලෙස දක්වන්නමාණය ප්‍රඅදාළ භූමි ප්‍ර) -:

| % | අංශක |
|---|---|
| 0– 8 | (4............................ (ට අඩු 5 |
| 8– 16 | (4. 5– 09) ............................ |
| 16– 30 | )09 –17............................. ( |

30– 45 )17 –31............................... (

ට වැඩි 60 (............................ (ට වැඩි 31

IV. පසේ ස්වභාවය

| ප්‍රධාන පස් වර්ගය | එහි ගැඹුර * | අක්කර :හෙක් / මාණයප්‍ර | මුළු ඉඩමේ ප්‍රතිශතයක් ලෙස | මතුපිට ගල් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

දේශ ඇත්නම්ගල් සහිත ප්‍ර) ග)එය ද සඳහන් කළ යුතු යි(

*1 .මී .සෙ) ගැඹුරු පස .100 ට වැඩි ( 2. මධ්‍යස්ථ ගැඹුරු පස .මී .සෙ)60 –100 (

3 . නොගැඹරු පස .මී.සෙ)60 ට අඩු(

V. භූ විද්‍යාත්මක කරුණු ම /ධාන පාෂාණ වර්ගයප්‍ර) -:තුපිට දැකිය හැකි වෙනත් ලක්ෂණ(

VI. කෘෂි දේශගුණික කලාපය

VII. ජල මූලාශ්‍රය (.මී.කි )ඒවාට ඇති දුර

.......................................... ...............................

.......................................... ...............................

VIII. භූගත ජල මට්ටමට ඇති ගැඹුර මීටර් -:

IX. භූමියේ ජලවහන තත්ත්වය -:

| ජලවහනය | භූමි ප්‍රමාණය:පර්/අක් / | ප්‍රතිශතය |
|---|---|---|
| මනා ජලවහනය | | |
| මධ්‍යස්ථ ජලවහනය | | |
| දුර්වල ජලවහනය | | |

13. පවත්නා ඉඩම් පරිහරණය හා එහි තත්ත්වය-:

| ඉඩම් පරිහරණ වර්ගය | කළමනාකරණ තත්ත්වය * | ප්‍රමාණය හෙක්ටයාර් | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| එනතුව | | | 100 |

*WM මනා කළමනාකරණය = MM ස්ථ කළමනාකරණයමධ්‍ය = PMදුර්වල කළමනාකරණය =
(ඉඩමේ දළ සටහනක ඉඩම් පරිහරණ අනුව කොටස් කර දක්වන්න)

13.1 ගොඩනැගිලි සංඛ්‍යාව හා වර්ග ප්‍රමාණය (අඩි .ව) -:

13.2 අවට ඉඩම් පරිහරණය-:

13.3 ඉඩමේ පෙර පැවති ඉඩම් පරිහරණය-:

14. රක්ෂිත සඳහා වෙන් වී ඇති ප්‍රමාණය-:

I. ජල රක්ෂිත ......-:මාණය හෙක්වෙන් කර ඇත්නම් එම ප්‍ර (ගංගා ඇළ දොල වැව්)

II. මාර්ග රක්ෂිත වෙන් කර ඇත්නම් එම ප්‍රමාණය හෙක්.................................... -:

III. වෙනත් ( ආදී වශයෙන් නම් කරන්නපුරාවිද්‍යා ,වනජීවී ,වන)

15. අනවසර ලෙස භුක්ති විදින ප්‍රමානය හෙක්ටයාර් හා කට්ටි සංඛ්‍යාව .......................................-:

16. වෙනත් අහිතකර ලක්ෂණ ඇති භූමි තිබේ නම් එහි ප්‍රමාණය හෙක්..........................................-:

17. ඉහත 14,15,...................................................-:මාණය හෙක්ටයාර්හැර ඉතිරිව ඇති බිම් ප්‍ර 16

18. සමාජ ආර්ථික තොරතුරු-:

18.1 ඉඩමේ පදිංචි පවුල් පිළිබඳ විස්තර

| පවුල් | කට්ටි සංඛ්‍යාව | පවුලේ සංඛ්‍යාව | ජනසජංඛ්‍යාව |
|---|---|---|---|
| නීත්‍යානුකූල | | | |
| නීත්‍යානුකූල නොවන | | | |

18.2 ඉඩමේ පදිංචි කරුවන්ගේ ආදායම් මාර්ග

| ආදායම් මාර්ගය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| | |

19. යටිතල පහසුකම්-:

I. ඉඩමට ප්‍රවේශ වන මාර්ගයන් -:

| මාර්ගය | මාර්ගයේ නම | පාරේ පළල | ඉඩමේ සිට එයට ඇති දුර |
|---|---|---|---|
| ප්‍රධාන මාර්ගය | | | |
| අප්‍රධාන මාර්ගය | | | |
| කරත්ත පාර | | | |
| අඩිපාර | | | |

II. සේවා මධ්‍යස්ථාන -:

| සේවා මධ්‍යස්ථානය | සේවා මධ්‍යස්ථානයේ නම | එයට දුර කි.මී. |
|---|---|---|
| ආසන්න කඩමණ්ඩිය | | |
| ආසන්න නගරය | | |
| ප්‍රධාන නගරය | | |

III. විදුලි පහසුකම් -:

| | | |
|---|---|---|
| ඉඩමේ සිට විදුලි පහසුකම්වලට ඇති දුර කි.මී . | තෙකලා | |
| | දෙකලා | |

IV. ජල පහසුකම් -:

| | |
|---|---|
| නළ ජල පහසුකම් ඇත්නම් එයට ඇති දුර කි.මී. | |

V. දුරකථන පහසුකම්-:

| | |
|---|---|
| ඉඩමේ සිට දුරකථන සන්ධිස්ථානයට ඇති දුර කි.මී. | |

VI. පාසලට ඇති දුර-:(.මී.කි)

| | |
|---|---|
| කනිෂ්ට පාසලට | |
| ජ්‍යෙෂ්ඨ පාසලට | |

VII. රෝහල -:ස්ථානය මධ්‍යසෞඛ්‍ය /

20. වෙනත් තොරතුරුසංස්කෘතික ,ත්මකපෙජව විද්‍යා ,ත්මකපුරා විද්‍යා ,දේශපාරිසරික සංවේදී ප්‍ර) -: යාබද රක්ෂිතයක් ඇත්නම් එයට ඉඩමේ සිට ඇති දුර ,දේශහා සංචාරක වශයෙන් වැදගත් ප්‍ර (.සඳහන් කරන්න

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

ඉඩමේ ස්වභාවය පෙන්වන දල සටහන-:(ඇමුණුමක් ලෙස දක්වන්න)

විමර්ශනය කල දිනය:-
විමර්ශනය කල නිලධාරියා:-
තනතුර:-
ආයතනය/දෙපාර්තමේන්තුව:-
අත්සන:-

(සැ.යු. - මෙම ආකෘති දිස්ත්‍රික් කාර්යාල සතුව පවතින බැවින් අලුතින් සකස් කල යුතු නොවේ)

## ඉඩම් යෝග්‍යතා වාර්තාව සඳහා ආකෘතිය

1. ඉල්ලීම් කළ ආයතනයේ නම ...................................................... -:
2. පිහිටීම :- ......................................................
   2.1 දිස්ත්‍රික්කය :- ......................................................
   2.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ......................................................
   2.3 ප්‍රාදේශීය සභාව :- ......................................................
   2.4 ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය :- ......................................................
   2.5 ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම හා අංකය :- ......................................................
   2.6 ගම ...................................................... -:
   2.7 ග්‍රිඩ් අංක (පිහිටීම් දක්වන සිතියම අමුණන්න) :- උ ......................................................
   ......................................................නැ -:
   2.8 අභලේ සිතියම /ABMP සිතියම :- ......................................................
   2.9 ගම් පිඹුර හා ලොට් අංකය ...................................................... -:
   2.10 ප්‍රවේශ මාර්ගය :- ......................................................
3. ඉඩම් ප්‍රමාණය............................................ (හෙක්)පර් .................... රූඩ් ................ අක් -:
4. ඉඩමේ අයිතිය හා භුක්තිය ...................................................... -:
5. භෞතික ලක්ෂණ :- ......................................................
   5.භූ විෂමතාවය 1 :- ......................................................
   5.පස 2 ...................................................... -:
   5. වාර්ෂික වර්ෂාමධ්‍ය 3පතනය ...................................................... -:
   (ළඟම ඇති කාලගුණ මධ්‍යස්ථානයේ නමත් සමඟ වර්ෂාපතනය දක්වන්න(
   5. වාර්ෂික උෂ්ණත්වයමධ්‍ය 4 ...................................................... -:
   5.කෘෂි දේශගුණික කලාප 5 ...................................................... -:
   5.බෑවුම් කලාප 6

| | ප්‍රතිශතය |
|---|---|
| 0– 8% | (4. (ට අඩු 5 |
| 8– 16 % | )4.5 –09 ( |
| 16– 30% | ( 09– 17) |
| 30– 45% | ( 17– 31) |
| %ට වැඩි 60 | )31 ට වැඩි ( |

ඉඩමේ දල සටහන මත බෑවුම් කලාප ලකුණු කර දක්වන්න

5.-: යජලය ලබා ගත හඅකි මාධ්‍ය 7

6. වර්තමාන ඉඩම් පරිහරණය ...................................................... -:
7. යටිතල පහසුකම් :- ......................................................
   7.1 ඉඩමට ඇති ප්‍රවේශ මාර්ගය හා එහි පළල ......................................................-:
   7.2 ළඟම ඇති ප්‍රධාන මාර්ගය හා එහි පළල ...................................................... -:

7.3 ළඟම ඇති අප්‍රධාන මාර්ගය හා එහි පළල ...................................................... -:
7.4 ළඟම ඇති ග්‍රාමීය සේවා මධ්‍යස්ථානය ...................................................... -:
7.5 ග්‍රාමීය සේවා මධ්‍යස්ථානයට ඇති දුර ...................................................... -:
7.6 ඉඩමේ සිට විදුලි පහසුකම්වලට දුර කි.......................... දෙකලා ............. තෙකලා .මී .
7.7 ඉඩමේ සිට දුරකථන සන්ධිස්ථානයට දුර කි.මී. ...................................................... -:
7.8 ඉඩමේ සිට නලජල පහසුකම්වලට දුර කි.මී. ...................................................... -:

8. නිර්දේශිත ඉඩම් යෝග්‍යතාවය-:
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

9. නිරීක්ෂණ නිගමන හා යෝජනා -:
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

10. සහභාගී වූ අනෙක් අයගේ නම්........................................................................................... -:

දිනය -: ............................................................. -:නම
තනතුර............................................................ -:
............................................................. -: ක්කයදිස්ත්‍රි

ඉහත ආකෘතිය හුදෙක් මග පෙන්වීම සඳහා පිළියෙළ කර ඇති අතර, පරික්ෂා කර බලනු ලබන ඉඩමේ ස්වභාවය අනුව අඩංගු කරුණු වල යම් යම් වෙනස්කම් සිදු කර ගත හැකි වේ.

විවිධ අවශ්‍යතා සඳහා ඉඩම් යෝග්‍යතාවය නිර්ණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක පහතින් දක්වා ඇත. ඒ අනුව එම සාධක භාවිතා කර යම් භූමියක් කුමන කටයුත්තකට සුදුසුදැයි තීරණය කල හැකි වේ. එසේ තීරණය කිරීම සඳහා උපයෝගී කර ගත හැකි ආකාරය වගු උපයෝගී කර ඉදිරිපත් කර ඇත.

<u>වගුව **2.3** කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් යෝග්‍යතාව හඳුනා ගැනීම.</u>

| පරාමිතීන් | 1 මට්ටම | 2 මට්ටම | 3 මට්ටම | 4 මට්ටම |
|---|---|---|---|---|
| 1) බෑවුම | 0-30% | 30-40% | 40-60% | >60% |
